| අනු අංකය | බැංකුවේ නම | ගිණුම් අංකය | 2025.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය | 2025.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය | 2025.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්) | අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය |
|---|---|---|---|---|---|---|
| | | | (රු.) | (රු.) | | |
| 1 | ලංකා බැංකුව තප්රෝජේන් | 0007041949 | - | - | - | දෙසැම්බර් 2025 |
| 2 | ලංකා බැංකුව මන්නාරම | 0007041952 | 262,168,434 | - | - | දෙසැම්බර් 2026 |
| 3 | ලංකා බැංකුව මන්නාරම | 0007041958 | 116,945,874 | - | - | දෙසැම්බර් 2027 |
| 4 | ලංකා බැංකුව මන්නාරම | 0007041959 | 72,105,884 | - | - | දෙසැම්බර් 2028 |
| 5 | ලංකා බැංකුව මන්නාරම | 0007041960 | 42,728,029 | - | - | දෙසැම්බර් 2029 |
| 6 | ලංකා බැංකුව මන්නාරම | 0007041961 | 133,755,565 | - | - | දෙසැම්බර් 2030 |
| 7 | ලංකා බැංකුව මන්නාරම | 0007041964 | 64,712,421 | - | - | දෙසැම්බර් 2031 |
| | එකතුව | | 692,416,207 | | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

..............................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 15. 02. 2026

K.Yogendran
Chief Accountant
District Secretariat
Mannar.

## 3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 1003.07.02 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට අදාළ ලියාපදිංචි කිරීමේ ගාස්තු | 6,327,000.00 | 6,327,000.00 | 6,720,090.00 | 106.21 |
| 1003.07.03 | පෞද්ගලික දැව ප්‍රවාහනය | 63,000.00 | 63,000 .00 | 52,118.00 | 82.73 |
| 1003.07.05 | ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ බලපත්‍ර ගාස්තු | 9,000.00 | 9,000.00 | 8,400.00 | 93.33 |
| 1003.07.99 | අනෙකුත් බලපත්‍ර සහ බදු | 844,000.00 | 844,000.00 | 689,506.00 | 81.70 |
| 2002.01.01 | රජයේ ගොඩනැගිලි කුලී | 3,716,000.00 | 3,716,000.00 | 4,448,596.21 | 119.71 |
| 2002.02.99 | පොලිය - වෙනත් | 2,728,000.00 | 2,728,000.00 | 3,109,392.90 | 113.98 |
| 2003.02.13 | විභාග හා අනෙකුත් ගාස්තු | 3,500.00 | 3,500.00 | 12,000.00 | 342.86 |
| 2003.02.14 | මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු සහ අනෙකුත් | 2,579,000.00 | 2,579,000.00 | 2,418,880.00 | 93.79 |
| 2003.02.03 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ගාස්තු | 3,028,000.00 | 3,028,000.00 | 2,669,530.00 | 88.16 |
| 2003.02.06 | වන සත්ව හා වෘක්ෂලතා සංරක්ෂණ ආඥා පනත යටතේ ගාස්තු | 180,600.00 | 180,600 | 71,350.00 | 39.51 |
| 2003.02.99 | විවිධ පරිපාලන ගාස්තු | 180,300.00 | 180,300.00 | 463,646.59 | 257.15 |
| 2003.99.00 | අනෙකුත් ලැබීම් | 8,068,000.00 | 8,068,000.00 | 6,668,268.48 | 82.65 |
| 2004.01.00 | සමාජ ආරක්ෂණ දායකත්වය සහ වැ.අ. විශ්‍රාම වැටුප් දායකත්වය | 18,175,000.00 | 18,175,000.00 | 27,084,277.17 | 149.02 |
| 2006.02.01 | ප්‍රාග්ධන වත්කම් විකිණීම - වාහනය | 5,277,000.00 | 5,277,000.00 | 0.00 | 0.00 |
| 2006.02.02 | ප්‍රාග්ධන වත්කම් විකිණීම - අනෙකුත් | 362,400.00 | 362,400.00 | 668,700.00 | 184.52 |
| එකතුව | | **51,540,800.00** | **51,540,800.00** | **55,084,755.00** | **106.88** |

## 3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| වැය විෂයය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තථ්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | අයවැය ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| **පුනරාවර්තන වියදම්** | | | | |
| **පුද්ගල පඩිනඩි** | | | | |
| 1001 - වැටුප් හා වේතන | 254,000,000 | 316,500,000 | 314,745,644.89 | 99.45 |
| 1002 - අතිකාල හා නිවාඩු දින වැටුප් | 8,300,000 | 10,000,000 | 9,576,051.58 | 95.76 |
| 1003 - වෙනත් දීමනා | 186,000,000 | 154,700,000 | 152,230,659.42 | 98.40 |
| **ගමන් වියදම්** | | | | |
| 1101 - දේශීය | 5,700,000 | 5,030,000 | 4,172,522.56 | 82.95 |
| **සැපයීම්** | | | | |
| 1201 - ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 15,500,000 | 13,820,000 | 13,459,182.60 | 97.39 |
| 1202 - ඉන්ධන | | | | |
| 002 - ඉන්ධන දීමනා | 5,700,000 | 4,600,000 | 4,560,425.66 | 99.14 |
| 009 - සංචිත වාහනය සඳහා ඉන්ධන | 11,100,000 | 6,950,000 | 6,591,013.98 | 94.83 |
| 010 - වෙනත් අරමුණු සඳහා ඉන්ධන | 5,800,000 | 2,150,000 | 1,958,378.36 | 91.09 |
| 1203 - ආහාර පාන හා නිල ඇඳුම් | | | | |
| 002 - නිල ඇඳුම් | 2,164,000 | 2,104,000 | 2,045,500.00 | 97.22 |
| 1205 - වෙනත් | 2,936,000 | 2,936,000 | 2,828,517.20 | 96.34 |
| **නඩත්තු වියදම්** | | | | |
| 1301 - වාහන | 17,800,000 | 17,800,000 | 15,800,800.82 | 88.77 |
| 1302 - යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 8,000,000 | 7,650,000 | 7,142,528.61 | 93.37 |
| 1303 - ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 11,500,000 | 11,200,000 | 10,409,967.61 | 92.95 |
| 1304 - මෘදුකාංග නඩත්තුව | 2,000,000 | 420,000 | 224,299.29 | 53.40 |
| **සේවා** | | | | |
| 1401 - ප්‍රවාහන | 1,750,000 | 1,300,000 | 1,246,899.55 | 95.92 |
| 1402 - තැපැල් හා සන්නිවේදන | 8,000,000 | 5,850,000 | 5,205,511.46 | 88.98 |
| 1403 - විදුලිය හා ජලය | 16,000,000 | 11,400,000 | 9,449,969.71 | 82.89 |
| 1404 - බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 1,100,000 | 550,000 | 513,056.94 | 93.28 |
| 1405 - පිරිසිදු සේවා | 13,000,000 | 10,800,000 | 10,517,408.51 | 97.38 |
| 1407 - ආරක්ෂක සේවා | 7,500,000 | 10,950,000 | 9,908,801.57 | 90.49 |
| 1409 - වෙනත් | | | | |
| 138 - යන්ත්‍රෝපකරණ සහ කාර්යාල උපකරණ සේවා ගිවිසුම | 3,800,000 | 2,300,000 | 1,896,497.95 | 82.46 |
| 139 - වාහන රක්ෂණ | 2,250,000 | 1,540,000 | 774,885.23 | 50.32 |
| 140 - විවිධ සේවා වියදම් | 5,000,000 | 5,000,000 | 3,986,659.68 | 79.73 |
| **මාරු කිරීම්** | | | | |
| 1506 - රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී | 1,100,000 | 450,000 | 371,343.12 | 82.52 |
| **එකතුව** | **596,000,000** | **606,000,000** | **589,616,526.30** | **97.29** |

| | | | | |
|---|---|---|---|---|
| **මූලධන වියදම්** | | | | |
| **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | | | | |
| 2001 - ගොඩනැගිලි සහ ඉදිකිරීම් | | | | |
| 048 - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 50,000,000 | 50,000,000 | 32,767,766.64 | 65.54 |
| 049 - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 69,800,000 | 69,800,000 | 69,472,678.18 | 99.53 |
| 2002 - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 6,000,000 | 6,000,000 | 5,971,423.45 | 99.52 |
| 2003 - වාහන | 16,200,000 | 16,200,000 | 2,181,257.46 | 13.46 |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | | |
| 2102 - ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 20,000,000 | 20,000,000 | 19,796,485.95 | 98.98 |
| 2103 - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 24,000,000 | 24,000,000 | 23,517,106.69 | 97.99 |
| **හැකියා වර්ධනය** | | | | |
| 2401 - කාර්ය මණ්ඩල පුහුණු | 3,000,000 | 3,000,000 | 2,057,299.89 | 68.58 |
| **වෙනත් මූලධන වියදම්** | | | | |
| 2509- වෙනත් | - | 115,000,000 | 81,429,427.74 | 70.81 |
| **මූලධන වියදම්** | **189,000,000** | **304,000,000** | 237,193,446.00 | **78.02** |
| **පුනරාවර්තන හා මූලධන වියදම්වල මුළු එකතුව** | **785,000,000** | **910,000,000** | **826,809,972.30** | **90.85** |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| අනු අංකය | ශීර්ෂ අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තථ්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන% ලෙස |
|---|---|---|---|---|---|---|---|
| | | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| **1.** | 001 | ජනාධිපති ලේකම් කාර්යාලය | ජාතික එලදායිතා සම්මානය, ලෝක ළමා දින ජාතික වැඩසටහන, ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන, ප්‍රජා එලදායිතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන | 4,259,000.00 | 4,259,000.00 | 3,046,408.90 | **71.53** |
| **2.** | 020 | මැතිවරණ කොමිෂන් සභාව | කාර්ය මණ්ඩල දීමනාව සහ දිරි දීමනා | 5,242,939.75 | 5,242,939.75 | 5,240,479.75 | **99.95** |
| **3.** | 101 | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | දාන ශාලාවේ ඉතිරි වැඩ නිම කිරීම, බුදු මැදුර (කුඩා) සකස් කිරීම, සංඝාවාසයේ සිවිලිම ගැසීම, අබලන් වූ විහාර මන්දිරය සාදා ගැනීම, ශ්‍රී ලාංකික දිනය ජාතික උත්සවය | 2,021,000.00 | 2,021,000.00 | 2,017,950.42 | **99.85** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **4.** | 102 | මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | වැඩිහිටි, ආබාධිත සහ වකුගඩු රෝගී දීමනාව, පරිපාලන වියදම්, ආයතනගතව නේවාසිකව සිටින ප්‍රතිලාභලාභීන්, අස්වැසුම වැඩසටහන | 323,996,390.00 | 323,996,390.00 | 322,908,367.43 | **99.66** |
| **5.** | 103 | ආරක්ෂක අමාත්‍යාංශය | වැටුප් සහ අනෙකුත් පුනරාවර්තන, නිවාස හානි, ආරක්ෂක මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය, ජලපවාහනය සඳහා දෙපස රැඳවුම් බිත්තියක් ඉදි කිරීම මගින් ගංවතුර ජල බලපෑම් අවම කිරීම, ඉදිකිරීම, ඇළේ රොන්මඩ ඉවත් කිරීම, පීඩාවට ලක් වූ පිරිස් සඳහා පානීය ජලය සැපයීම, ප්‍රගති සමාලෝචන රැස්වීම, පිසූ ආහාර, මරණ වන්දි, පුහුණු වැඩසටහන, හානියට පත් මුළුතැන්ගෙයි උපකරණ සහ අත්‍යාවශය ගෘහ උපකරණ මිලදී ගැනීම, බලපෑමට ලක්වූ සිසුන්හට පොත්පත් සහ ඇඳුම් පැළඳුම් මිලදී ගැනීම, ආපදාවෙන් හානියට පත් නිවාස ප්‍රතිසංස්කරණය කිරීම | 1,469,895,867.25 | 804,895,867.25 | 641,262,474.04 | 79.67 |
| **6.** | 110 | අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය | සමථ මණ්ඩල ගෙවීම්, , පුහුණු වැඩසටහන, භාෂා දිනය 2025, ආයතනික භාෂා සැලසුම් පිළියෙල කිරීමේ ධාරිතා සංවර්ධන වැඩසටහන, බහුවාර්ගික, බහුආගමික ජන | 8,631,881.00 | 8,631,881.00 | 5,902,468.80 | 68.38 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | කණ්ඩායම් අතර සාමය සහජීවනය සහ සංහිඳියාව වැඩිදියුණු කිරීබම් ව්‍යාපෘතිය, වැටුප් සහ අනෙකුත් පුනරාවර්තන | | | | |
| **7.** | 111 | සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | වැටුප් සහ අනෙකුත් පුනරාවර්තන, වකුගඩු රෝග ජලවිදුලිය, ඖෂධ නිෂ්පාදන යන්ත්‍රෝපකරණ ප්‍රසම්පාදනය | 1,198,096.00 | 1,198,096.00 | 1,061,589.52 | 88.61 |
| **8.** | 112 | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය | ගමන් සහ ලිපි ද්‍රව්‍ය වියදම්, ප්‍රගති සමාලෝචන රැස්වීම, සංචාරක ප්‍රදේශය පිළිබඳ ශක්‍යතා අධ්‍යයන වැඩසටහන, ස්වයං රැකියා සඳහා පුහුණුව | 327,000.00 | 327,000.00 | 243,523.65 | 74.47 |
| **9.** | 117 | ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | 200,000,000.00 | 200,000,000.00 | 151,571,764.08 | **75.79** |
| **10.** | 118 | කෘෂිකර්ම පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය | බිම්සවිය ප්‍රාදේශිය කාර්යාලීය උපකරණ මිලදී ගැනීම, වැටුප් සහ අනෙකුත් පුනරාවර්තන, ඉඩම් අත්පත් කර ගැනීම සඳහා පරිපාලන වියදම්, ගබඩාව අලුත්වැඩියා කිරීම, කෘෂිකාර්මික කමිටු රැස්වීම, දිවයින පුරා වන සතුන් පිළිබඳ වැඩසටහන, පුහුණු වැඩමුළු, රථය අලුත්වැඩියා | 15,563,749.00 | 15,563,749.00 | 14,225,149.15 | **91.40** |
| **11.** | 123 | නාගරික සංවර්ධන, ඉදිකිරීම සහ නිවාස අමාත්‍යාංශය | නිවාස ව්‍යාපෘතිය, ප්‍රතිලාභීට විදුලිය සහ ජල සැපයුම් සම්බන්ධතාවය, යටිතල පහසුකම් ව්‍යාපෘතිය | 181,721,039.62 | 181,721,039.62 | 153,746,565.28 | **84.61** |
| **12.** | 124 | ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය | වැටුප් සහ අනෙකුත් පුනරාවර්තන, දිස්ත්‍රික්ක මට්ටමින් නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන, ග්‍රාමීය සංවර්ධන වැඩසටහන, ග්‍රාම සංවර්ධන සැලසුම් සකස් කිරීම, අන්තර්ජාල ඇබ්බැහිය හා මත්භාවිතය තුළින් | 17,211,726.00 | 17,211,726.00 | 15,312,281.42 | **88.96** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | පාසල් දරුවන් මුදවාගැනීමේ වැඩසටහන, අපනයනාභිමුඛ තල් පලතුරු පල්ප් නිෂ්පාදන සහ අශය එකතු කළ නිෂ්පාදන ව්‍යාපෘතිය, ලූනු වගා ව්‍යාපෘතිය, උපදේශන වැඩසටහන, ප්‍රජාශක්ති , පුහුණු වැඩසටහන, ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ දත්ත පද්ධතිය ස්ථාපනය කිරීම | | | | |
| **13.** | 126 | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | ගමන් සහ ලිපි ද්‍රව්‍ය වියදම් | 181,700.00 | 181,700.00 | 141,939.15 | **78.12** |
| **14.** | 130 | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | වැටුප් සහ අනෙකුත් පුනරාවර්තන, විදේශ ගමන් වියදම්, සංචාරක බංගලා වැඩිදියුණු කිරීම, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 18,771,740.00 | 18,771,740.00 | 14,613,318.86 | **77.85** |
| **15.** | 149 | කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | වැටුප් සහ අනෙකුත් පුනරාවර්තන, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 5,547,852.82 | 5,547,852.82 | 5,010,491.54 | **90.31** |
| **16.** | 151 | ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය | දිස්ත්‍රික් ධීවර සම්බන්ධීකරණ කමිටු රැස්වීම | 32,600.00 | 32,600.00 | 32,600.00 | **100.00** |
| **17.** | 160 | පරිසර අමාත්‍යාංශය | වැටුප් සහ අනෙකුත් පුනරාවර්තන, ලෝක පරිසර දිනය, ග්‍රෝයින් ක්ෂේත්‍ර ආරක්ෂාව වැඩිදියුණු කිරීම, පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන, ලෝක ආහාර වැඩසටහන (WFP) මගින් සහාය දක්වන ලද ADAPT4R වැඩසටහන් ක්‍රියාකාරකම් | 37,740,449.00 | 37,740,449.00 | 31,006,408.96 | **82.16** |
| **18.** | 171 | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය | පෝෂණ දිමනාව, උදෑසන ආහාර, ගුරු අභිමානි, දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන සහ ළමා සංවර්ධන කමිටු රැස්වීම, කාන්තා දින වැඩසටහන, කාන්තා ප්‍රධානත්වයෙන් යුත් පවුල් සඳහා වන | 107,278,614.90 | 107,278,614.90 | 97,809,945.25 | **91.17** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | වැඩසටහන, මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික සතිය, උපදේශන සහ දැනුවත් කිරීමේ වැඩසටහන්, 'වනිතා නවෝදය' සහ 'දිවියට අරුතක්', "නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රියාකාරකම් හේතුවෙන් පීඩාවට පත් වූවන්" සඳහා වන වැඩසටහන, ගමන් සහ ලිපි ද්‍රව්‍ය වියදම් | | | | |
| **19.** | 186 | ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය | පුනරාවර්ථන වියදම්, "ප්‍රජා ශක්ති" ජාතික ව්‍යාපෘතිය | 19,000,000.00 | 19,000,000.00 | 14,809,687.67 | **77.95** |
| **20.** | 189 | මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | තැපැල් වියදම්, ලිපි ද්‍රව්‍ය, ගමන් වියදම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් සංග්‍රහ වියදම් | 95,220.00 | 95,220.00 | 44,069.40 | **46.28** |
| **21.** | 194 | තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය | ක්‍රීඩා සතිය වැඩසටහන - ස්වවායු ව්‍යායාම වැඩසටහන | 200,000.00 | 200,000.00 | 132,000.00 | **66.00** |
| **22.** | 196 | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය | තැපැල්, ලිපි ද්‍රව්‍ය, විදුලිය සහ ජලය, ගමන්, පිරිසිදු කිරීමේ සේවාව, තාක්ෂණ හුවමාරු වැඩසටහන, ගෝලීය ව්‍යවසායකත්ව සතියේ වැඩසටහන, ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම, ප්‍රාග්ධන වත්කම් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම, ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම | 1,918,075.00 | 1,918,075.00 | 1,841,029.43 | **95.98** |
| **23.** | 201 | බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව | දහම් පාසල් ගුරු දීමනා | 10,000.00 | 10,000.00 | 10,000.00 | **100.00** |
| **24.** | 202 | මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | වැසිකිළි ප්‍රතිසංස්කරණය කිරීම, ලිපි ද්‍රව්‍ය | 410,000.00 | 410,000.00 | 410,000.00 | **100.00** |
| **25.** | 203 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | මඩු වන්දනා නිකේතනය ඉදිකිරීම, ක්‍රිස්තියානි ආගමික ස්ථාන සහ පල්ලි සඳහා පහසුකම් සැලසීම, නත්තල් කැරොල් තරඟය සහ ලිපි ද්‍රව්‍ය | 40,400,800.00 | 40,400,800.00 | 28,396,684.77 | **70.29** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **26.** | 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | දුප්පත් කලාකරුවන් සඳහා දීමනා, කලාභූෂණ සම්මාන උළෙල, ප්‍රගති සමාලෝචන රැස්වීම, දොළොස්මහේ පහන, ප්‍රාදේශීය සාහිත්‍ය උළෙල, කලා වැඩමුළුව හා කලා තරඟාවලිය, ගමන්, ලිපි ද්‍රව්‍ය සහ තැපැල් වියදම් | 847,100.00 | 847,100.00 | 764,446.82 | **90.24** |
| **27.** | 210 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | ලිපි ද්‍රව්‍ය සහ තැපැල් සහ සන්නිවේදනය වියදම්, පුවත්පත් මිලදී ගැනීම | 24,800.00 | 24,800.00 | 14,822.56 | **59.77** |
| **28.** | 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | ආබාධිතයන් සඳහා ජාතික ක්‍රීඩා තරඟාවලිය, CBR ජාතික වැඩසටහන, ජාතික සංස්කෘතික ප්‍රසංගය "සිත් රූ - 2025" , ස්වයං රැකියාවල නියුතු ආබාධ සහිත පුද්ගලයන් සඳහා ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන, ESU වැඩසටහන, "දිරිය" ජාතික වෙළඳ සහ වෘත්තීය නිපුණතා ප්‍රදර්ශනය, වැටුප් සහ අනෙකුත් පුනරාවර්තන, | 9,805,190.00 | 9,805,190.00 | 9,180,071.00 | **93.62** |
| **29.** | 217 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම, ප්‍රාදේශීය නිරීක්ෂණ කමිටුව, ළමා සභා, නිවුන් ආධාර, වෛද්‍ය සහ පෝෂණ ආධාර, කැපකරු දෙගුරු, ගෘහ භාණ්ඩ මිලදී ගැනීම, හදිසි ආධාර, ලෝක ළමා දින වැඩසටහන | 1,056,800.00 | 1,056,800.00 | 1,035,744.52 | **98.01** |
| **30.** | 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | ගෘහස්ථ ක්‍රීඩාංගණයක් ඉදිකිරීම, පිහිනුම් තටාකය විවෘත කිරීමේ මහෝත්සවය, ගමන් වියදම්, ලිපිද්‍රව්‍ය, ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 54,851,040.00 | 3,000,000.00 | 2,894,197.68 | **96.47** |
| **31.** | 227 | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | වැටුප් සහ අනෙකුත් පුනරාවර්තන, යන්ත්‍රසූත්‍ර හා කාර්යාල උපකරණ සේවා ගිවිසුම | 7,201,027.48 | 7,201,027.48 | 7,066,709.12 | **98.13** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **32.** | 237 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | විමධ්‍යගත අයවැය සංවර්ධන වැඩසටහන | 23,000,000.00 | 23,000,000.00 | 18,382,641.70 | **79.92** |
| **33.** | 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | රජයේ ගබඩාවේ මෙහෙයුම් වියදම්, වියළන අංගන ඉදිකිරීම, වියළන යන්ත්‍ර ඒකකය සඳහා මෝටරයක් මිලදී ගැනීම, නල ළිං මෝටරයක් සහ කපන යන්ත්‍රයක් මිලදී ගැනීම | 10,462,450.00 | 10,462,450.00 | 9,130,122.76 | **87.27** |
| **34.** | 248 | ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව | කාර්යාල ගොඩනැගිල්ල සහ වට තාප්පය වර්ණාලේප කිරීම | 2,000,000.00 | 2,000,000.00 | 1,960,813.55 | **98.04** |
| **35.** | 252 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | ජනගහන සංගණනය, බෝග කැපීම, වාහන සේවා, ගමන් වියදම්, අතිකාල හා නිවාඩු දින වැටුප්, ලිපි ද්‍රව්‍ය, ඉන්ධන, වාහන නඩත්තුව, කෘෂිකර්ම සංගණනය, පුහුණු පන්ති | 8,868,952.16 | 8,868,952.16 | 8,393,848.38 | **94.64** |
| **36.** | 253 | විශ්රාම වැටුප් දෙපාර්තමේන්තුව | සිවිල් විශ්‍රාම වැටුප්, වැ.අ. විශ්‍රාම වැටුප්, මුද්‍රණය, අතිකාල සහ වෙනත් පුනරාවර්තන | 34,454,992.14 | 34,454,992.14 | 34,143,420.87 | **99.10** |
| **37.** | 284 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | වන සතුන්ගේ ප්‍රහාර සඳහා වන්දි | 38,100.00 | 38,100.00 | 38,100.00 | **100.00** |
| **38.** | 286 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | වැටුප් සහ වෙනත් වියදම් | 779,901.00 | 779,901.00 | 778,566.00 | **99.83** |
| **39.** | 290 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | FI අංශ වැඩිදියුණු කිරීම | 1,951,259.64 | 1,951,259.64 | 1,809,282.99 | **92.72** |
| **40.** | 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | අතිකාල සහ නිවාඩු දින වැටුප්, ලිපිද්‍රව්‍ය, මුද්‍රණය සහ සන්නිවේදන, විදුලිය සහ පුහුණු වැඩසටහන | 1,079,000.00 | 1,079,000.00 | 961,464.29 | **89.11** |
| **41.** | 326 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව | ගමන් වියදම් හා ලිපිද්‍රව්‍ය | 267,000.00 | 267,000.00 | 229,877.42 | **86.10** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **42.** | 327 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | සංවර්ධන වැඩසටහන, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමේ ඉඩම් පරිහරණ කමිටු රැස්වීම්, ගමන් වියදම් , ලිපි ද්‍රව් | 793,500.00 | 793,500.00 | 763,378.86 | **96.20** |
| **43.** | 328 | මිනිස්බල සහ රැකිරක්ෂා දෙපාර්තමේන්තුව | උසස් පෙළ සිසුන් සඳහා ප්‍රායෝගික අත්දැකීම් වැඩසටහන, දිස්ත්‍රික් රැකියා පොළ, ස්මාර්ට් යෞවන වැඩසටහන, තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන, අවිධිමත් අංශයේ සංවර්ධන වැඩසටහන, ඩිජිටල් ව්‍යවසායකත්ව වැඩසටහන, හෙද ක්ෂේත්‍රයට අදාළ දත්ත ඇතුළත් කිරීම, කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන, ගමන් වියදම් , ලිපි ද්‍රව් සහ අනෙකුත් පුනරාවර්තන | 666,718.66 | 666,718.66 | 583,888.24 | **87.58** |
| | | එකතුව | | | | | |

## 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 31-12-2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31-12-2025 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| **9151** | ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 580,745,145.57 | 580,745,145.57 | - | - |
| **9152** | යන්ත්‍රෝපකරණ | 280,062,536.01 | 280,062,536.01 | - | - |
| **9153** | ඉඩම් | 29,870,000.00 | 29,870,000.00 | - | - |
| **9154** | අස්පෘශ්‍ය වත්කම් | 0 | 0 | - | - |
| **9155** | ජීව විද්‍යාත්මක වත්කම් | 0 | 0 | - | - |
| **9160** | ෙකරීගෙන යන වැඩ | 243,971,042.77 | 243,971,042.77 | - | - |
| **9180** | බදු දෙන ලද වත්කම් | 0 | 0 | - | - |
| **එකතුව** | | **1,134,648,724.35** | **1,134,648,724.35** | - | - |

## 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. NPCG/MN/A/FA/DS/02/2025/01 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2026 මැයි 12 දින.

ගණන්දීමේ නිලධාරී
මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**ශීර්ෂය 265 - මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 265 - මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2025 අංක 19 දරන ජාතික විගණන (සංශෝධන) පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

Page **2** of **8**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) එක් වාහනයක වටිනාකම් ද්විගණනය වී ඇති බැවින් මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු. 3,600,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක් විසින් සමාලෝචිත වර්ෂයේ සහ ඊට පෙර වර්ෂවලදී වෙන්දේසි කිරීම් මගින් බැහැර කළ අයිතම 202 ක පිරිවැය මූල්‍ය නොවන වත්කම්වලින් අඩු නොකිරීම හේතුවෙන් රු. 487,105 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක් විසින් සමාලෝචිත වර්ෂයේ සිදු කරනු ලැබූ නව මූලධන කාර්යයන් 21 ක එකතුව රු. 46,355,464 ක් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ රු.3,555,500කට මිලදී ගත් විදුලි ට්‍රාන්ස්ෆෝමරය සහ රු.6,150,496 කට මිලදී ගත් පරිගනක ඒකක 07ක්, ලැප්ටොප් පරිගනක 05ක්, ඡායා පිටපත් යන්ත්‍ර 06ක්, ප්‍රොජෙක්ටර් 06 ක්, යූපීඑස් 02ක් සහ මුද්‍රණ යන්ත්‍ර 02ක් ආදිය මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් වෙන්දේසි කිරීම් මගින් බැහැර කරනු ලැබූ රු. 10,000 ක් පිරිවැය වූ ඡායා පිටපත් යන්ත්‍රය සහ රු. 45,000ක් පිරිවැය වූ ලැප්ටොප් පරිගනකය වෙනුවට කාර්යාල භාවිතා කරමින් පැවැති රු. 432,000ක් වටිනා ඡායා පිටපත් යන්ත්‍රය සහ රු. 224,200ක් වටිනා ලැප්ටොප් පරිගනනය, වත්කම්වලින් ඉවත් කිරීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් රු. 601,200 කින් අඩුවෙන් දක්වා තිබුණි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

Page 4 of 8

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) මූලධන වැය විෂයන් 05ක් සහ පුනරාවර්තන වැය විෂයන් 16ක් සඳහා සලසා තිබූ එකතුව රු. 223,034,000ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 148,731,648ක් පමණක් උපයෝජනය කිරීමෙන් ඉතිරිවීම් රු. 74,302,352ක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50(ii) අනුව ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිවත් සම්පූර්ණවත් පිළියෙල කරන බවට වග බලා ගැනීම ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වුවද, වැය විෂයන් 12ක් සඳහා සලසා තිබූ මූල්‍ය ප්‍රතිපාදනවලින් සියයට 11 සිට 79ක් දක්වා පරාසයකින් වූ ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කර තිබූ බව නිරීක්ෂණය විය.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2025 දෙසැම්බර් 17 දිනැති අංක 02/2025 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ 03 හි 3.3 ඡේදය ප්‍රකාරව, 2025 දෙසැම්බර් 31 දිනට හෙළිදරව් නොකළ බැරකම් වැය විෂයන් 10 ක් සඳහා රු. 2,247,862 ක් 2026 වර්ෂයේදී පියවීම් සිදුකර තිබුණි.

3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

(අ) 2025 වර්ෂයේ වියදම් වාර්තා ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ 15ක් විසින් පුනරාවර්තන වැය විෂයන් එකතුව 41ක් යටතේ සලසා තිබූ මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය නොකිරීමෙන් එම සලසා තිබූ ප්‍රතිපාදනවලින් සියයට 07 සිට සියයට 96ක් දක්වා පරාසයකින් එකතුව රු. 147,320,503ක් ඉතිරි වී තිබුණි. තවද, අමාත්‍යාංශ 05ක් විසින් පුනරාවර්තන වැය විෂයන් 08ක් යටතේ සලසා දී තිබූ මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය නොකිරීමෙන් රු. 404,483 ක් හෙවත් සියයට 100ක් සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, අමාත්‍යාංශ 14 ක ප්‍රාග්ධන වියදම් ප්‍රතිපාදන 19 න් සියයට 10 සිට සියයට 100 දක්වා පරාසයක, රුපියල් 808,245,350 ක් භාවිතයට නොගෙන ඉතිරි කර ඇති බව සොයා ගන්නා ලදී.

3.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තිය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුවුවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුවුවත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසි, කළමනාකරණ තීරණ ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02ක් ඉක්මවූ රු.568,075 තැන්පතු 06ක් සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන්ට ආපසු ගෙවීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2020 සැප්තැම්බර් 18 දිනැති අංක 16/2020 දරන අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාගේ චක්‍රලේඛයේ 10 ඡේදය | ප්‍රාදේශීය ලේකම්වරුන් අවම වශයෙන් මාස 04කට වරක් හෝ සියළුම ග්‍රාම නිලධාරී කාර්යාල ආවරණය වන පරිදි පරීක්ෂණයකට භාජනය කළයුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අයත් ග්‍රාම නිලධාරී කාර්යාල එවැනි පරීක්ෂණයකට භාජනය කර නොතිබුණි. |
| (ඇ) | 2002 අංක 24 දරන සුභසාධන ප්‍රතිලාභ පනතේ 23 වගන්තිය | සුභසාධන ප්‍රතිලාභ ලබා ගැනීමට සුදුසුකම් ඇති අයගේ ලැයිස්තුව වසරකට වරක් යාවත්කාලීන කළයුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 විසින් ප්‍රතිලාභීන්ගේ ලැයිස්තුව වසරකට වරක් යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඈ) | 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කළ කාර්ය පටිපාටි රීතින්හි 01 වන වෙළුමේ XVIII පරිච්ඡේදයේ 251 වගන්තිය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක, 2025 දෙසැම්බර් 31 දිනට එකම සේවා ස්ථානයක වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කළ ඒකාබද්ධ සේවයේ නිලධාරීන් 55 දෙනෙකු, ග්‍රාම සේවා නිලධාරී නිලධාරීන් 92 දෙනෙකු සහ සංවර්ධන නිලධාරීන් 124 දෙනෙකු සම්බන්ධයෙන් ස්ථානමාරු පටිපාටි සැළැස්ම ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඉ) | 2008 අගෝස්තු 20 දිනැති අංක 04/2008 දරන ඉඩම් කොමසාරිස් ජනරාල් චක්‍රලේඛය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක් විසින් පවත්වාගෙන යනු ලබන ඉඩම් නොමැති පුද්ගලයින්ගේ ලේඛනය සෑම වර්ෂයකම යාවත්කාලීන කර එම ලේඛනයේ පිටපතක් පළාත් ඉඩම් කොමසාරිස්වරයාට සහ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාට යැවීමට පියවර ගෙන නොතිබුණි. |

**3.6 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම**

2020 අගොස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව, තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීමෙන් පසුව, තත්කාර්ය අතුරු අග්‍රිම සම්බන්ධයෙන් වූ කාර්යය අවසන් වී දින 10ක් තුළ ආපසු ගෙවිය යුතු ය. එසේ වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අත්තිකාරම් ලේඛනය ප්‍රකාරව අවස්ථා 65කදී නිලධාරීන් 10කට ලබාදුන් එකතුව රු. 2,027,284 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කිරීමේදී දින 13 සිට දින 125ක් දක්වා කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන මගින්, මන්නාරම නගරයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සීමාව තුළ ප්‍රදේශයේ පදිංචිකරුවන් 866 දෙනෙකුගේ ප්‍රයෝජනය සඳහා බෝක්කු ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ, පුදුකුඩිඉරිප්පු මාර්ගයේ අභ්‍යන්තර මාර්ගවලට වැසි ජලය ගලා යාමට හැකි පරිදි හියුම් පයිප්ප (Hume pipe) සම්බන්ධ කිරීම සඳහා රු. 925,387 ක මුදලක් වැය කර තිබූ නමුත්, ඉන් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි. එසේම, එම මාර්ගයේ ගමන් කරන වාහන සහ මහජනතාවට අපහසුතාවයක් ඇති වන ආකාරයෙන් එය ඉදිකර තිබූ බව ද නිරීක්ෂණය විය.

**4.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන සහ විමධ්‍යගත අයවැය අරමුදල් යටතේ, තල් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනයට සම්බන්ධ ප්‍රතිලාභීන් 49 දෙනෙකුගේ ජීවනෝපාය වැඩිදියුණු කර එමගින් අනාගතයේ රැකියා අවස්ථා 100 ක් නිර්මාණය කිරීම අරමුණු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ තල් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන මධ්‍යස්ථාන ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම, යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සහ ප්‍රතිලාභීන් පුහුණු කිරීම සඳහා රු. මිලියන 9.1 ක් වැය කර තිබූ නමුත්, විගණන දින වන විටත් නිෂ්පාදන මෙහෙයුම් ආරම්භ කර නොතිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය සඳහා සම්බන්ධ කර තිබූ ප්‍රතිලාභීන්ගෙන් 13 සිට 34 දක්වා ප්‍රතිලාභීන් සම්පූර්ණ පුහුණු වැඩමුළුවලට සහභාගී වී නොතිබුණි.

**4.1.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

සමාලෝචිත වර්ෂයේ විමධ්‍යගත අයවැය යටතේ, තරවන්කෝට්ටෙයි ගම්මානයේ ප්‍රධාන මාර්ගයේ සිට මන්නාරමේ පනංකට්ටු කොට්ටු මාළු වෙළඳපොළ දක්වා ඇළ මාර්ගය ඉදිකිරීම් කර්මාන්තය, 2025 සැප්තැම්බර් 01 දින ආරම්භ කර 2025 නොවැම්බර් 17 දින අවසන් කිරීමට මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත් අත්සන් කර තිබුණි. එම කාර්යය කොන්ත්‍රාත්කරු විසින් දින 45 ක් ඉක්ම යාමෙන් පසු ආරම්භ කර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සියයට 30 ක කාර්යයන් පමණක් අවසන් කර ඒ සඳහා රු. 1,506,862 ක් වැය කර තිබුණි. අඛණ්ඩව පැවැති අයහපත් කාලගුණය හේතුවෙන්, එම කාර්යය නිම නොකර අතරමග අතහැර දමා තිබූ අතර ඒ සඳහා සලසා තිබූ ඉතිරි මුදල් ද ආපසු හරවා යවා තිබුණි. මේ හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා වැය කළ මුළු මුදලම නිශ්කාර්ය වියදමක් ව පැවැතුණි.

**4.1.4 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන් මූල්‍ය ප්‍රතිපාදන යටතේ මඩු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 15 දිනට නිම කිරීමට සැලැසුම් කර තිබූ සෝදිනගර අභ්‍යන්තර මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු 2026 මාර්තු 26 දින වන විටත් අවසන් කර නොතිබුණි. එසේ වුවත්, අදාල කාර්යයන් අවසන් කර ඇති බව සලකා 2025 දෙසැම්බර් 30 දින රු. 1,348,492 ක වටිනාකමට චෙක්පතක් ලියා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගිණුම් ශාඛාවේ රඳවා තබා මාරු නොකළ චෙක්පතක් ලෙස 2026 මාර්තු සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනවල පැවැති බව නිරීක්ෂණය විය.

**4.2 වත්කම් කළමනාකරණය**

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් මුසලි ප්‍රාදේශීය ලේකම් වර්ෂ 05 කට අධික කාලයක සිට අභාවිතව තත්ත්වයෙන් නවතා තිබූ අංක LE 6500 දරන බර වාහනය අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට විගණන දිනය වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඇති යතුරුපැදි 10 සහ විදුලි ජනක යන්ත්‍ර 03 දීර්ඝ කාලයක සිට භාවිතා කර නොමැති අතර ඒවා අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ බැහැර කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.3 කළමනාකරණ දුර්වලතා**

(අ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව ප්‍රකාරව, නානාට්ටාන්, මුසලි සහ මඩු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වර්ග 126 කට අයත් අයිතම 316ක් ඉන්වෙන්ටරි ලේඛනයේ ලේඛනගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ විමධ්‍යගත අයවැය යටතේ ව්‍යාපෘති හඳුනා ගැනීම, සංවර්ධන අංශය, ව්‍යාපෘති අනුමත කිරීම, අරමුදල් නිදහස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, වැඩසටහන් අධීක්ෂණය සහ අනෙකුත් කරුණු සම්බන්ධයෙන් 2025 ජනවාරි 29 දිනැති අංක 01/2025 දරන මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

**5. මානව සම්පත් කළමනාකරණය**

2025 දෙසැම්බර් 31 දිනට මට්ටම් 04හි අනුමත කාර්ය මණ්ඩලය 668ක් වුවද, තථ්‍ය කාර්ය මණ්ඩලය 574ක්ව පැවැතීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ පුරප්පාඩු 94ක් පිරවීමට පියවර ගෙන නොතිබුණි.

එම්.ජී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

එම්.ජී මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

Page 8 of 8

## 4. 04 වන පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

### 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තථ්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 90%-100% | 75%-89% | 50%-74% |
| ඉඩම් බලපත්‍ර | - | 76% | - |
| උප්පැන්න සහතික, මරණ සහතික, විවාහ සහතික | 100% | - | - |
| වාහන ආදායම් බලපත්‍ර | 106% | - | - |
| ජාතික හැඳුනුම්පත් | 102% | - | - |
| ව්‍යාපාර ලියාපදිංචිය | - | 78% | - |

## 5. 05 වන පරිච්ෙඡ්දය – තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1. දරිද්‍රතාවය සෑම ආකාරයකින්ම තුරන් කිරීම

රට තුළ පවතින සමාජ-ආර්ථික විෂමතා හේතුවෙන් ඇතැම් කලාප නිරන්තරයෙන් ඉහළ දරිද්‍රතා මට්ටමකට ගොදුරු වී සිටී. මෙය අප සමාජයේ මුල් බැසගෙන ඇති ගැඹුරු ව්‍යුහාත්මක ගැටලු කිහිපයක්ම මනාව පෙන්නුම් කරයි. 1990 සිට 2015 දක්වා කාලය තුළ ලොව පුරා අන්ත දරිද්‍රතාවයෙන් පෙළෙන ජනගහනය අඩකටත් වඩා අඩු කිරීමට අප සමත් වුවත්, මූලික මානව අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකිව තවමත් ලක්ෂ සංඛ්‍යාත පිරිසක් අරගල කරමින් සිටිති. එබැවින්, **සෑම ආකාරයකින්ම සහ සෑම ස්ථානයකදීම දරිද්‍රතාවය මුලිනුපුටා දැමීම** මානව වර්ගයා ඉදිරියේ ඇති අතිමහත් අභියෝගයකි. මෙම උදාර මෙහෙවර සාර්ථක කර ගැනීම උදෙසා එක්සත් ජාතීන්ගේ **තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs)** ප්‍රබල කැපවීමක් සිදු කර ඇත. 2030 වර්ෂය වන විට දරිද්‍රතාවය මුළුමනින්ම අවසන් කිරීමේ ඉලක්කය සපුරා ගැනීමට නම්, වඩාත් දුප්පත් සහ කොන්වූ ප්‍රජාවන් හඳුනාගෙන ඔවුන්ට සෘජු සහන සැලසීම, මූලික යටිතල පහසුකම් සහ සේවාවන් සඳහා සැමට සමාන ප්‍රවේශයක් ලබා දීම, ගැටුම් සහ දේශගුණික විපර්යාස හේතුවෙන් ආපදාවන්ට ලක්වූ ප්‍රජාවන් නැවත නඟා සිටුවීම සහ ඔවුන්ගේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම යන කටයුතු සිදුවීම අත්‍යවශ්‍ය කරුණක් බව අවධාරණය කළ යුතුය

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්කගත ප්‍රතිඵල | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා අත්කරගෙන ඇති ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50%-74% | 75%-100% |
| | දරිද්‍රතාවය අඩු කිරීම | ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම | **ආපදා සහන සේවා:** 'දිත්වා' (Ditwa) සුළි කුණාටුවෙන් පීඩාවට පත්, දරිද්‍රතාවයෙන් පෙළෙන ප්‍රතිලාභීන් 24,000ක් සඳහා රුපියල් 187,339,584.45ක වටිනාකමින් යුත් වියළි සලාක සහ පිසූ ආහාර වේල් ලබා දීමට පියවර ගෙන ඇත. **රාජ්‍ය නොවන සංවිධාන දායකත්වය:** 'දිත්වා' ආපදාවෙන් බලපෑමට ලක්වූ ජනතාව වෙත රුපියල් 50,000,000.00ක වටිනාකමින් යුත් ආහාර සහ ආහාර නොවන අත්‍යවශ්‍ය ද්‍රව්‍ය බෙදා හැරීම රාජ්‍ය නොවන සංවිධාන මගින් සිදු කරන ලදී. | - | - | 100% |
| | | | **සමාජ ආරක්ෂණ දීමනා:** වර්ෂය තුළ සුදුසුකම් ලත් වැඩිහිටියන් 1,229ක් සඳහා රුපියල් 71,766,000.00ක වැඩිහිටි දීමනා ද, ආබාධිත පුද්ගලයින් 1,816ක් සඳහා රුපියල් 212,110,000.00ක ආබාධිත දීමනා ද, වකුගඩු රෝගීන් 285ක් සඳහා රුපියල් 32,050,000.00ක වකුගඩු රෝගී දීමනා ද වශයෙන් මුළු දීමනා ගෙවීම් සිදු කරන ලදී. | - | - | 100% |
| | | | **සුබසාධක ප්‍රතිලාභ:** 2025 වර්ෂය තුළ සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය යටතේ සුදුසුකම් ලත් පවුල් 22,653ක් තෝරා ගෙන ඇති අතර, ඒ සඳහා රුපියල් 82,294,367.73ක දීමනා ප්‍රදානය කර ඇත. | - | - | 100% |
| | | | ප්‍රජාශක්ති ව්‍යාපෘති: දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද ප්‍රජාශක්ති ව්‍යාපෘති වෙනුවෙන් රුපියල් 615,650.00ක ප්‍රතිපාදන වැය කර ඇත. | - | - | 100% |
| | | | **නිවාස සංවර්ධනය: නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය මගින් නිවාස 51ක් ඉදිකර දීමට රුපියල් 72,746,253.00ක මුදලක් වැය කර ඇත. තවද, ISRC රාජ්‍ය නොවන සංවිධානය මගින් නිවාස 125ක් ඉදිකර දී ඇති අතර, එහි සමස්ත වටිනාකම රුපියල් 125,000,000.00 කි.** | - | - | 100% |

**සෑම වයස් කාණ්ඩයකම පුද්ගලයින් සඳහා නිරෝගී ජීවිත සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම**

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්කගත ප්‍රතිඵල | ජයග්‍රහණ දර්ශක | මෙ දක්වා අත්කරගෙන ඇති ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
| | යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම. | ගුණාත්මක අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය සහ ආරක්ෂිත සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය. | ගර්භනී මව්වරුන් 2,757ක් සඳහා රුපියල් 84,529,985.00ක වටිනාකමින් යුත් පෝෂණ ආහාර පැකට් ලබා දීම,<br><br>පෙර පාසල් දරුවන් 651ක් සඳහා රුපියල් 10,167,830.00ක වටිනාකමින් යුත් උදෑසන ආහාර වේල් සැපයීම,<br><br>පෙර පාසල් ගුරුවරුන් 12 දෙනෙකු සඳහා රුපියල් 824,000.00ක "ගුරු අභිමානී" දීමනා ප්‍රදානය කිරීම. | - | - | 100% |
| | | | ප්‍රතිලාභීන් 150ක් සඳහා රුපියල් 5,769,231.00ක වටිනාකමින් යුත් විදුලි සම්බන්ධතා ලබා දීම,<br><br>ප්‍රතිලාභීන් 124ක් සඳහා රුපියල් 3,763,524.00ක වටිනාකමින් යුත් ජල සම්බන්ධතා ලබා දීම. | - | - | 100% |

**සැමට ඇතුළත් වූ සහ සාධාරණ තත්ත්වයේ අධ්‍යාපනයක් සහතික කිරීම සහ ජීවිතාන්තය දක්වා ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම.**

සැමට ඇතුළත් වූ සහ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීම යනු, තිරසාර සංවර්ධනය සඳහා පවතින වඩාත්ම බලගතු සහ ඔප්පු කරන ලද මාර්ගයක් ලෙස අධ්‍යාපනය පිළිගැනීම යළි තහවුරු කිරීමකි. මෙම ඉලක්කය මගින් 2030 වසර වන විට සියලුම ගැහැණු සහ පිරිමි දරුවන් නොමිලේ මූලික සහ ද්විතීයික පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කරන බව සහතික කරයි. එමෙන්ම, දැරිය හැකි මිලකට වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශයක් ලබා දීම, ස්ත්‍රී පුරුෂ භාවය සහ ආර්ථික අසමානතා තුරන් කිරීම සහ ගුණාත්මක උසස් අධ්‍යාපනයක් සඳහා සැමට පොදු ප්‍රවේශයක් ලබා ගැනීමද මෙහි අරමුණයි.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්කගත ප්‍රතිඵල | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා අත්කරගෙන ඇති ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | **0% - 49%** | **50% - 74%** | **75%- 100%** |
| | ගුණාත්මක අධ්‍යාපනය | සිසුන් සැමට දැරිය හැකි මිලකට සහ උසස් තත්ත්වයේ අධ්‍යාපන යටිතල පහසුකම් සඳහා සමාන ප්‍රවේශයක් ලබා දීම සහතික කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ රු. 54,000,000.00 ක වටිනාකමකින් Mn/St. Xavier's Boys National School හි ගෘහස්ථ ක්‍රීඩාංගණයක් ඉදිකරන ලදී. | - | - | 100% |
| | | | රාජ්‍ය නොවන සංවිධාන (NGO) විසින් සෞඛ්‍ය, අධ්‍යාපන, පාරිසරික, කාන්තා, ළමා සහ තරුණ බලගැන්වීමේ වැඩසටහන් සඳහා ක්ෂේත්‍ර මට්ටමින් රුපියල් 622,000,000.00ක් වටිනා ආධාර සහ පහසුකම් ලබා දී ඇත. | - | - | 100% |

**සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම්වල සුලභතාවය සහ තිරසාර කළමනාකරණය සහතික කිරීම.**

විශාල පිරිසක් ජල හිඟයට මුහුණ දෙන රටවල් සංඛ්‍යාව ඉහළ යමින් පවතින අතර, නියඟය සහ කාන්තාරකරණය වැනි තත්ත්වයන් මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර කර තිබේ. 2030 වසර වන විට සැමට ආරක්ෂිත සහ දැරිය හැකි මිලකට පානීය ජලය ලබා දීම සඳහා, ප්‍රමාණවත් යටිතල පහසුකම්වල ආයෝජනය කිරීම, සනීපාරක්ෂක පහසුකම් සැපයීම සහ සනීපාරක්ෂක පුරුදු දිරිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. ජලය ආශ්‍රිත පරිසර පද්ධති ආරක්ෂා කිරීම සහ යථා තත්ත්වයට පත් කිරීම ද මේ සඳහා අතිශයින්ම වැදගත් වේ.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්කගත ප්‍රතිඵල | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා අත්කරගෙන ඇති ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | **0% - 49%** | **50% - 74%** | **75%- 100%** |
| | පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව | සැමට ආරක්ෂිත සහ දැරිය හැකි මිලකට පානීය ජලය සඳහා විශ්වීය සහ සාධාරණ ප්‍රවේශයක් ලබා ගැනීම. | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය මගින් ප්‍රතිලාභීන් 124 දෙනෙකුට රුපියල් 3,763,524.00ක වටිනාකමින් යුත් ජල සම්බන්ධතා ලබා දී ඇත. | - | - | 100% |
| | | සියලුම අංශ හරහා ජල භාවිතයේ කාර්යක්ෂමතාව සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම සහ ජල හිඟයට විසඳුම් සෙවීමට මෙන්ම ජල හිඟයෙන් පීඩාවට පත්වන ජනතාවගේ සංඛ්‍යාව විශාල ලෙස අවම කර ගැනීමට පිරිසිදු ජලය තිරසාර ලෙස ලබා ගැනීම සහ සැපයීම සහතික කිරීම. | රාජ්‍ය නොවන සංවිධාන (NGO) විසින් ක්ෂේත්‍ර මට්ටමින් විවිධ ආධාර සහ පහසුකම් ලබා දී ඇති අතර, විශේෂයෙන්ම දුෂ්කර ප්‍රදේශවල ජනතාවට පිරිසිදු පානීය ජල පහසුකම් ලබා දීම සඳහා ඔවුන් වැඩි අවධානයක් යොමු කර ඇත. | - | - | 100% |

**දැරිය හැකි මිලකට පිරිසිදු බලශක්තිය**

අද ලෝකය මුහුණ දෙන සෑම ප්‍රධාන අභියෝගයකටම සහ උදාවන සෑම අවස්ථාවකටම බලශක්තිය මූලික වේ. රැකියා උත්පාදනය, ආරක්ෂාව, දේශගුණික විපර්යාස, ආහාර නිෂ්පාදනය හෝ ආදායම් මට්ටම් ඉහළ නැංවීම වැනි ඕනෑම කරුණකදී සැමට බලශක්තිය ලබාගැනීමට ඇති හැකියාව අත්‍යවශ්‍ය වේ. මෙම ඉලක්කය සපුරා ගැනීම අනෙකුත් තිරසාර සංවර්ධන ඉලක්කයන් සමඟද එකිනෙක බැඳී පවතින බැවින් එය විශේෂ වැදගත්කමක් උසුලයි. සැමට බලශක්තිය ලබාදීම, බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ නව ආර්ථික හා රැකියා අවස්ථා හරහා පුනර්ජනනීය බලශක්ති භාවිතය දිරිගැන්වීම මගින්, වඩාත් තිරසාර හා සියලු දෙනා ඇතුළත් සමාජයක් ගොඩනැගීමටත්, දේශගුණික විපර්යාස වැනි පාරිසරික ගැටලුවලට සාර්ථකව මුහුණ දීමටත් හැකියාව ලැබේ.

මන්නාරම දිස්ත්‍රික්කයේ ජනගහනය වර්ධනය වන විට ලාභදායී බලශක්තිය සඳහා පවතින ඉල්ලුමද ඉහළ යනු ඇත. දැනට පවතින පොසිල ඉන්ධන මත යැපෙන ආර්ථික රටාව අපගේ දේශගුණයට අහිතකර ලෙස බලපායි. එබැවින් 2030 වසර වන විට හත්වන තිරසාර සංවර්ධන ඉලක්කය (SDG 7) සපුරා ගැනීමට නම්, සූර්ය, සුළං සහ තාප බලශක්තිය සඳහා ආයෝජනය කිරීම, බලශක්ති ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ සැමට බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීම අත්‍යවශ්‍ය වේ. පිරිසිදු හා වඩා කාර්යක්ෂම බලශක්තියක් සැපයීම සඳහා යටිතල පහසුකම් පුළුල් කිරීම සහ තාක්ෂණය නවීකරණය කිරීම, රටේ ආර්ථික සංවර්ධනයට මෙන්ම පාරිසරික ආරක්ෂාවටද මහත් රුකුලක් වනු ඇත.

කෙසේ වෙතත්, මෙම ගැටලුව සම්පූර්ණයෙන්ම විසඳී නොමැත. පිරිසිදු ඉන්ධන සහ නවීන තාක්ෂණය සඳහා පවතින ප්‍රවේශය පුළුල් කිරීමත්, ගොඩනැගිලි, ප්‍රවාහන හා කර්මාන්ත වැනි අංශවලදී පුනර්ජනනීය බලශක්තිය වඩාත් කාර්යක්ෂමව භාවිතා කිරීමත් තවදුරටත් කළ යුතුව ඇත. ලෝකයේ බලශක්ති පද්ධති පරිවර්තනය කිරීම උදෙසා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයෝජන ඉහළ නැංවීමටත්, වඩාත් ගැලපෙන නියාමන රාමු සහ නව්‍ය ව්‍යාපාරික ආකෘති ඔස්සේ බලශක්ති අංශය දියුණු කිරීමටත් විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්කගත ප්‍රතිඵල | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා අත්කරගෙන ඇති ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
| 7 CLEAN ENERGY | දැරිය හැකි මිලකට පිරිසිදු බලශක්තිය | අපගේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි දැරිය හැකි මිලකට, විශ්වාසනීය සහ නවීන බලශක්ති සේවාවන් ලබා ගැනීම සහතික කිරීම සඳහා ටර්බයින 10ක් ස්ථාපනය කිරීම. | මන්නාරම දිස්ත්‍රික්කයේ පවුල් 40,000කට ආසන්න සංඛ්‍යාවක් කිසිදු බාධාවකින් තොරව අඛණ්ඩව විදුලි බලය ලබා ගනී. | - | - | 100% |

**සැමට ඇතුළත් වූ සහ තිරසාර ආර්ථික වර්ධනයක්, සැමට පූර්ණ හා ඵලදායී රැකියා අවස්ථා සහ අභිමානවත් රැකියා පරිසරයක් ප්‍රවර්ධනය කිරීම.**

අන්තර්ක්‍රියාකාරී දත්ත දර්ශන මගින්, කෘෂිකාර්මික අංශය ඇතුළුව සියලුම රැකියා ක්ෂේත්‍රවල පවතින අවිධිමත් රැකියා ප්‍රමාණය සහ ඒවා ස්ත්‍රී පුරුෂ භාවය අනුව බෙදී පවතින ආකාරය අපි පෙන්වා දෙන්නෙමු. ඵලදායී ක්‍රියාකාරකම්, අභිමානවත් රැකියා උත්පාදනය, ව්‍යවසායකත්වය, නිර්මාණශීලීත්වය සහ නවෝත්පාදනයන් දිරිගන්වන සංවර්ධන ඉලක්කගත ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණයි. මීට අමතරව, මූල්‍ය සේවා සඳහා පහසුකම් සැලසීම ඇතුළු ක්‍රමවේද හරහා ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් විධිමත් කිරීම සහ ඒවායේ වර්ධනය දිරිමත් කිරීම සිදු කෙරේ.

තිරසාර ආර්ථික වර්ධනය, ඉහළ ඵලදායිතාව සහ තාක්ෂණික නවෝත්පාදනයන් තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) මගින් දිරිමත් කරයි. බලහත්කාරී ශ්‍රමය, වහල්භාවය සහ මිනිස් ජාවාරම මුලිනුපුටා දැමීම සඳහා ගත යුතු ඵලදායී පියවරයන් මෙන්ම, ව්‍යවසායකත්වය දිරිමත් කිරීම සහ රැකියා උත්පාදනය මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. මෙම ඉලක්ක පෙරදැරි කරගනිමින්, 2030 වසර වන විට සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා පූර්ණ හා ඵලදායී රැකියා මෙන්ම අභිමානවත් සේවා පරිසරයක් සහතික කිරීම අපගේ ඉලක්කයයි.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්කගත ප්‍රතිඵල | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා අත්කරගෙන ඇති ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
| 8 GOOD JOBS AND ECONOMIC GROWTH | අභිමානවත් රැකියා සහ ආර්ථික වර්ධනය | පල්මිරා (තල්) පලතුරු මදය සැකසීමේ කටයුතුවල නිරත සාම්ප්‍රදායික නිෂ්පාදකයන්ගේ කණ්ඩායම් ශක්තිමත් කිරීම තුළින්, තරුණ තරුණියන් සහ ආබාධිත පුද්ගලයන් ද ඇතුළුව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා පූර්ණ හා ඵලදායී රැකියා අවස්ථා සහ අභිමානවත් සේවා පරිසරයක් සහතික කිරීම මෙන්ම, සමාන වටිනාකමක් ඇති කාර්යයන් සඳහා සමාන වැටුපක් ලබා දීම. | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) විසින් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ගොවීන් වෙත රුපියල් 3,500,000.00ක් වටිනා ජල පොම්ප 25ක් ලබා දෙන ලදී.<br>ක්‍රිසලිස් (CHRYSALIS - රාජ්‍ය නොවන සංවිධානය) විසින් පවුල් 25ක් වෙත එක් පවුලකට රුපියල් 500,000.00 බැගින් මුළු වටිනාකම රුපියල් 12,500,000.00ක් වන මූල්‍ය ආධාර ලබා දී ඇත.<br>ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මගින් රුපියල් 9,038,450.00ක් වටිනා තල් ආශ්‍රිත නිෂ්පාදන වැඩසටහන් සංවිධානය කරන ලදී. | - | - | 100% |

**ඔරොත්තු දෙන යටිතල පහසුකම් ගොඩනැගීම, සියල්ල ඇතුළත් තිරසාර කාර්මීකරණය සහ නවෝත්පාදනයන් දිරිගැන්වීම**

නවීන තාක්ෂණයන් සඳහා මූල්‍ය පහසුකම් ලබා ගැනීමේදී බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල් අසීරුතා රැසකට මුහුණ දෙයි. යටිතල පහසුකම් සහ නවෝත්පාදනයන් සඳහා ආයෝජනය කිරීම ආර්ථික වර්ධනය සහ සංවර්ධනය උදෙසා ඇති ප්‍රධානතම සාධක වේ. දැනට ලෝක ජනගහනයෙන් අඩකට වඩා නගරවල ජීවත් වන නිසා, පොදු ප්‍රවාහන පද්ධති සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගේ වැදගත්කම වඩ වඩාත් ඉහළ යමින් පවතී. ඒ හා සමානවම, නව කර්මාන්ත සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වර්ධනයද ඉතා තීරණාත්මක වේ.

නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම සහ බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම වැනි ආර්ථික හා පාරිසරික අභියෝගවලට කල්පවත්නා විසඳුම් සෙවීම සඳහා තාක්ෂණික දියුණුව අත්‍යවශ්‍ය සාධකයකි. තිරසාර කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සහ විද්‍යාත්මක පර්යේෂණ හා නවෝත්පාදනයන් සඳහා ආයෝජනය කිරීම යන කරුණු තිරසාර සංවර්ධනය පහසු කරවන වැදගත් පියවරයන් වේ.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්කගත ප්‍රතිඵල | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා අත්කරගෙන ඇති ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%-100 % |
| | කර්මාන්ත, නවෝත්පාදනය සහ යටිතල පහසුකම් | ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම ඉහළ නැංවීම සඳහා කලාපීය සහ ප්‍රවාහන යටිතල පහසුකම් ඇතුළුව, උසස් තත්ත්වයේ, විශ්වාසනීය, තිරසාර සහ ඔරොත්තු දෙන යටිතල පහසුකම් ගොඩනැගීම. මෙහිදී සැමට සාධාරණ සහ දැරිය හැකි මිලකට එම පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව සහතික කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ. | රවාහන, මහාමාර්ග, ක්‍රීඩා සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 200ක ප්‍රතිපාදන වෙන් කර, මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රමුඛතාවය ලබා දුන් මාර්ග 14ක් (කිලෝමීටර් 8.4ක්) ප්‍රතිසංස්කරණය කරන ලදී. නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 100ක් වෙන් කර, මන්නාරම දිස්ත්‍රික්කයේ තෝරාගත් මාර්ග 15ක් (කිලෝමීටර් 3.96ක්) ප්‍රතිසංස්කරණය කර ඇත. | - | - | 100% |
| | | සංවර්ධනය වෙමින් පවතින රටවල දේශීය තාක්ෂණික සංවර්ධනය, පර්යේෂණ සහ නවෝත්පාදන ප්‍රවර්ධනය | ක්‍රීඩා අමාත්‍යාංශය මගින් රුපියල් 69,210,000.00ක වියදමින් අවශ්‍ය සියලු පහසුකම් සහිත පිහිනුම් | - | - | 100% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | කිරීම. විශේෂයෙන්ම කර්මාන්ත විවිධාංගීකරණය සහ භාණ්ඩවල අගය එකතු කිරීම (value addition) සඳහා හිතකර ප්‍රතිපත්තිමය පරිසරයක් සහතික කිරීම මගින් මෙය සාක්ෂාත් කරගත හැකිය. | තටාකයක් ඉදිකරන ලදී. | | | |
| | | අපේ රටේ නිෂ්පාදන ක්‍රියාවලින් වඩාත් ශක්තිමත් කරමින්, කාර්මික සහ දේශීය නිෂ්පාදන සඳහා පවතින ප්‍රවේශය සැලකිය යුතු මට්ටමකින් පුළුල් කිරීම. | මුරුන්කන් ගබඩාවේ නඩත්තු සහ වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා රුපියල් 9,130,122.76ක මුදලක් වැය කර ඇත. | - | - | 100% |

**ශ්‍රී ලංකාව ඇතුළු ලොව පුරා රටවල් තුළ සහ රටවල් අතර පවතින අසමානතා අවම කිරීම.**

ශ්‍රී ලංකාව තුළ විවිධ මට්ටම්වලින් අසමානතා දක්නට ලැබේ. ආදායම, ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ආබාධිතභාවය, ලිංගික දිශානතිය, ජාතිය, සමාජ පන්තිය, වාර්ගිකත්වය, ආගම සහ අවස්ථාවන් ලැබීමේ විෂමතා ලොව පුරා තවමත් පැවතීම කනගාටුදායකය. මෙම අසමානතාවන් සමාජීය හා ආර්ථික සංවර්ධනයට බාධාවක් වන අතර, දරිද්‍රතාවය පිටුදැකීමට ඇති හැකියාව හීන කරමින් ජනතාවගේ ආත්ම අභිමානය සහ තෘප්තිමත් බව විනාශ කරයි. එමෙන්ම මෙවැනි අසමානතා අපරාධ, රෝගාබාධ සහ පාරිසරික පිරිහීම වැනි ගැටලු උත්සන්න කිරීමට හේතු විය හැක. යම් පිරිසක් සමාජයෙන් කොන් වී සිටී නම්, තිරසාර සංවර්ධනයක් උදා කරමින් සැමට වඩා යහපත් ලොවක් ගොඩනැගීමට අපට නොහැක.

මෑත කාලීනව ලොව බොහෝ ප්‍රදේශවල ආදායම් විෂමතාවය ඉහළ ගොස් ඇතත්, එහි වේගය රටින් රටට වෙනස් වේ. දිනෙන් දින වැඩිවන මෙම පරතරය පියවා ගැනීමට නම්, අඩු ආදායම් ලබන ජනතාව සවිබල ගැන්වීමටත්, ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය හෝ වාර්ගිකත්වය වැනි භේදයකින් තොරව සැමට ආර්ථික අවස්ථා සමානව ලබා දීමටත් ශක්තිමත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ යුතුය.
ආදායම් අසමානතාවය යනු ගෝලීය වශයෙන් විසඳුම් සෙවිය යුතු ගැටලුවකි. ඒ සඳහා මූල්‍ය වෙළඳපොළ සහ ආයතන පිළිබඳ අධීක්ෂණය සහ නියාමනය විධිමත් කිරීම, වැඩි අවශ්‍යතාවයක් පවතින කලාප වෙත සංවර්ධන ආධාර සහ විදේශීය සෘජු ආයෝජන දිරිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. එසේම, ජනතාවට ආරක්ෂිතව සංක්‍රමණය වීමට සහ නිදහසේ ගමන් කිරීමට අවස්ථාව සැලසීම ද මෙම පරතරය පියවා ගැනීමට ඇති ප්‍රධාන පියවරකි.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්කගත ප්‍රතිඵල | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා අත්කරගෙන ඇති ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%-100% |
| 10 REDUCED INEQUALITIES | අසමාන තාවයන් අවම කිරීම | ජාතිය, වාර්ගිකත්වය, සම්භවය, ආගම හෝ වෙනත් ඕනෑම තත්ත්වයක් නොතකා, සියලුම දෙනාගේ සමාජීය, ආර්ථික සහ දේශපාලනික සහභාගීත්වය සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම. | සංවර්ධන වැඩසටහන යටතේ කිලෝමීටර් 12.4ක මාර්ගයක් ප්‍රතිසංස්කරණය කරන ලදී. කිසිදු භේදයකින් තොරව ශ්‍රී ලංකාවේ සියලුම ජනවාර්ගික කණ්ඩායම්වලට ප්‍රතිලාභ ලැබෙන පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරිණි. | - | - | 100% |
| | | ආගමික ස්ථාන ගොඩනැගීම සහ සංවර්ධනය කිරීම මගින් සමාජ සාමය සහ සහජීවනය ඇති කිරීම. | සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් 2025 වසර තුළ අවදානමට ලක්විය හැකි පවුල් 22,653ක් වෙත රුපියල් 82,294,367.73ක වටිනාකමකින් යුත් ආධාර ලබා දී ඇත.<br>නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය විසින් නිවාස අවශ්‍යතාවය සහිත පවුල් 51ක් සඳහා, නියමිත නිර්ණායකයන්ට අනුකූලව රුපියල් 72,746,253.00ක වටිනාකමින් යුත් නිවාස ලබා දී ඇත. | - | - | 100% |
| | | | ලෝක ආහාර වැඩසටහන (WFP) විසින් ආපදා සූදානම ඉහළ නැංවීමේ 'Adapt 4R' වැඩසටහන පවත්වන ලදී. මීට අමතරව, පරිසර අමාත්‍යාංශය විසින් පාසල්, ආගමික සහ සංස්කෘතික මධ්‍යස්ථාන මෙන්ම ආගමික සංවිධාන සඳහා රුපියල් 4,609,145.91ක වටිනාකමකින් යුත් ආධාර ලබා දෙන ලදී. | - | - | 100% |
| | | යහපත් සමාජයක් ගොඩනැගීම සඳහා ජනතාවගේ සමාජීය, ආර්ථික සහ ආගමික තත්ත්වයන් සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම. | 'දිත්වා' (Ditwah) සුළි කුණාටුවෙන් පීඩාවට පත් වූවන් වෙනුවෙන් නිවාස පිරිසිදු කිරීම, නිවාස අලුත්වැඩියාව, ගෘහ උපකරණ ලබා දීම, නිවාස කුලී ගෙවීම සහ පාසල් සිසුන් සඳහා අවශ්‍ය අධ්‍යාපන උපකරණ ලබා දීම වැනි හදිසි සහන සේවා සඳහා රුපියල් 395,121,529.40ක මුදලක් වැය කර ඇත.<br>මඩු දේවස්ථාන වන්දනාකරුවන් සඳහා වූ විවේකාගාරය ඉදිකිරීමට රුපියල් 27,380,896.77ක මුදලක් වැය කර ඇත. | - | - | 100% |

**නගර සහ මානව ජනාවාස සියල්ලන් ඇතුළත්, ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ තිරසාර ලෙස ගොඩනැගීම**

තිරසාර සංවර්ධන ඉලක්ක (SDG 11) අංක 11හි අරමුණ වන්නේ සියල්ලන් ඇතුළත්, ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ තිරසාර නගර සහ මානව ජනාවාස නිර්මාණය කිරීමයි. දැරිය හැකි මිලකට නිවාස සහ අත්‍යවශ්‍ය සේවාවන් ලබාගැනීමේ පහසුකම්, අවිධිමත් ජනාවාස දියුණු කිරීම සහ ආරක්ෂිත හා දැරිය හැකි පොදු ප්‍රවාහන සේවා සහ හරිත අවකාශයන් සැපයීම මෙහිදී විශේෂයෙන් අවධාරණය කෙරේ. නාගරීකරණය නිසා පරිසරයට සිදුවන බලපෑම් අවම කිරීම, දේශගුණික හා ආපදා සූදානම වැඩි දියුණු කිරීම සහ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් සුරක්ෂිත කිරීම ද මෙම ඉලක්කයට අයත් වේ. ජනගහන වර්ධනය සහ සංක්‍රමණය හේතුවෙන් නගර ඉතා වේගයෙන් වර්ධනය වෙමින් පවතින අතර, විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල මහා නගර (mega-cities) බිහිවීමත්, නාගරික ජීවිතයේ අනිවාර්ය අංගයක් ලෙස පැල්පත් නිවාස බිහිවීමත් දැකිය හැකිය.

නගර තිරසාර කිරීම යනු රැකියා සහ ව්‍යාපාරික අවස්ථා උත්පාදනය කිරීම, ආරක්ෂිත සහ දැරිය හැකි නිවාස සැපයීම සහ ඔරොත්තු දෙන සමාජයක් සහ ආර්ථිකයක් ගොඩනැගීමයි. පොදු ප්‍රවාහන පද්ධති සඳහා ආයෝජනය කිරීම, හරිත පොදු අවකාශයන් නිර්මාණය කිරීම සහ සියලු දෙනාගේ සහභාගීත්වයෙන් යුත් ඇතුළත් නාගරික සැලසුම්කරණය සහ කළමනාකරණය මගින් මෙය සාක්ෂාත් කරගත හැකිය.

| ඉලක්ක අංකය | ඉලක්කය / අරමුණ | ඉලක්කගත ප්‍රතිඵල | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා අත්කරගෙන ඇති ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
| | තිරසාර නගර සහ ප්‍රජාවන් | සැමට ප්‍රමාණවත්, ආරක්ෂිත සහ දැරිය හැකි මිලකට නිවාස පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව සහතික කිරීම. | මන්නාරම දිස්ත්‍රික්කයේ ගැටුම්වලින් පීඩාවට පත් වූ පවුල් සඳහා රුපියල් මිලියන 1.5ක බැගින් වටිනාකමින් යුත් නිවාස 42ක් ලබා දෙන ලදී. මෙහි සමස්ත වටිනාකම රුපියල් මිලියන 62.87කි. | - | - | 100% |
| | | සැමට ප්‍රමාණවත්, ආරක්ෂිත සහ දැරිය හැකි නිවාස පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව සහතික කිරීම. ජාතික සහ කලාපීය සංවර්ධන සැලසුම් ශක්තිමත් කිරීම මගින් නාගරික, උප-නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ අතර පවතින ආර්ථික, සමාජීය සහ පාරිසරික බැඳීම් තවදුරටත් දිරිමත් කිරීම සහ වර්ධනය කිරීම. | උතුරු සහ නැගෙනහිර පළාත්වල ගැටුම්වලින් පීඩාවට පත් වූ පවුල් සඳහා රුපියල් මිලියන 0.9ක බැගින් වටිනාකමින් යුත් නිවාස 09ක් ලබා දෙන ලදී. මෙහි සමස්ත වටිනාකම රුපියල් මිලියන 8.1කි. | - | - | 100% |
| | | | පරිසර අමාත්‍යාංශය යටතේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) මූල්‍ය දායකත්වයෙන් රුපියල් මිලියන 28.64ක වියදමින් වංකාලෙයි මුහුදු රළ කඩන ව්‍යාපෘතිය (Vankalai sea breaker project) සාර්ථකව නිම කර ඇත. | | | |

## 5.2. තිරසාර සංවර්ධන ඉලක්කවල ජයග්‍රහණ සහ අභියෝග පිළිබඳ කෙටි සමාලෝචනයක් පහත දැක්වේ.




2025 වසර තුළ ක්‍රියාත්මක කරන ලද සුබසාධන වැඩසටහන් මගින් ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට සහ දරිද්‍රතාවය අවම කිරීමට විශාල දායකත්වයක් ලැබී ඇත. ඒ යටතේ වැඩිහිටියන් 1,229ක් සඳහා රුපියල් 71,766,000ක මුදලක් ද, ආබාධිත පුද්ගලයන් 1,816ක් සඳහා රුපියල් 212,110,000ක මුදලක් ද, වකුගඩු රෝගීන් 285ක් සඳහා රුපියල් 32,050,000ක මුදලක් ද ලබා දී ඇත. මීට අමතරව, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය මගින් සුදුසුකම් ලැබූ පවුල් 22,653ක් තෝරාගෙන ඒ සඳහා රුපියල් 82,294,367.73ක දීමනාවක් ලබා දීමට කටයුතු කෙරිණි.




ගර්භනී මව්වරුන් 2,757ක් සඳහා රුපියල් 84,529,985ක් වටිනා පෝෂණ ආහාර පාර්සල් ද, පෙර පාසල් දරුවන් 651ක් සඳහා රුපියල් 10,167,830ක් වටිනා උදෑසන ආහාර වේල ද, පෙර පාසල් ගුරුවරුන් 12ක් සඳහා රුපියල් 824,000ක් වටිනා 'ගුරු අභිමානි' අරමුදල් ද ලෙස සමස්තයක් වශයෙන් රුපියල් 95,521,815ක මුදලක් වෙන් කර ඇත. පෝෂණ ඌනතා සහ රෝගාබාධවලට මූලික වන හේතු ගණනාවක් සාර්ථකව පාලනය කිරීමට අපට හැකි වී තිබේ. මෙය ආයු අපේක්ෂාව ඉහළ දැමීමටත්, ළදරු සහ මාතෘ මරණ අනුපාත සැලකිය යුතු ලෙස අඩු කිරීමටත් ඉවහල් වී ඇත. අපගේ අධ්‍යාපන වැඩසටහන් මගින්, අනාගත මහජන සෞඛ්‍ය අභියෝගවලට මුහුණ දීම සඳහා සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ කුසලතා, ධාරිතාව සහ නිපුණතා වර්ධනය කරනු ලබයි. අපගේ විශේෂඥයින් විසින් එන්නත්කරණය, පාරිසරික හා වෘත්තීය සෞඛ්‍යය, සෞඛ්‍ය ප්‍රවර්ධනය, ආසාදන වැළැක්වීම සහ පාලනය, මෙන්ම හදිසි සෞඛ්‍ය තත්ත්වයන් වැනි ක්ෂේත්‍ර පිළිබඳව සෞඛ්‍ය වෘත්තිකයන්ට අවශ්‍ය සාක්ෂි සහ පර්යේෂණ සොයාගැනීම් ලබා දෙයි. අප සිදු කරන මෙම පර්යේෂණ, රටේ යහපැවැත්ම උදෙසා සෞඛ්‍ය ප්‍රතිපත්ති, සායනික හා මහජන සෞඛ්‍ය පිළිවෙත් සහ රසායනාගාර විද්‍යාවන් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරයි.




**අධ්‍යාපන අමාත්‍යාංශයේ අරමුදල් මගින් මන්නාරම සාන්ත සේවියර් පිරිමි ජාතික පාසලේ ගෘහස්ථ ක්‍රීඩාංගණයක් ඉදිකිරීම සඳහා රුපියල් 54,000,000ක් වැය කර ඇත.පාසල් සංවර්ධන කටයුතු යටතේ, ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමේ අරමුණින් පාසල්වල අධ්‍යාපන පරිසරය වඩාත් සුදුසු මට්ටමකට දියුණු කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව, ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් පාසල් ගොඩනැගිලි හා පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම හරහා සිසුන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලැබීමට අවශ්‍ය යහපත් අධ්‍යාපන පරිසරයක් නිර්මාණය කෙරේ.**




නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය මගින් අභ්‍යන්තරව අවතැන් වූ සහ අවදානමට ලක්විය හැකි ජනතාව සඳහා නොමිලේ ජල සම්බන්ධතා ලබා දී ඇත. ජනතාව නැවත පදිංචි කිරීමෙන් පසු, ඔවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා අදාළ අමාත්‍යාංශය විසින් විවිධ ක්‍රියාකාරකම් කඩිනම් කර ඇත. මෙම සියලු ව්‍යාපෘතිවල මූලික අරමුණ වන්නේ ජාතික ආර්ථිකයට දායක වීම සහ ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීමයි. විශේෂයෙන්ම මන්නාරම දිස්ත්‍රික්කයේ අභ්‍යන්තරව අවතැන් වූ පවුල් 124ක් සඳහා රුපියල් 3,763,524ක වටිනාකමින් යුත් නොමිලේ ගෘහස්ථ ජල සම්බන්ධතා ලබා දීම මෙහිලා කැපී පෙනේ. සැමට ආරක්ෂිත සහ දැරිය හැකි පානීය ජලය ලබා ගැනීමේ ගෝලීය ඉලක්කය (Universal and Equitable access to safe and affordable Drinking water) සපුරා ගැනීමට මෙම ව්‍යාපෘතිය ඉවහල් වේ.




ශ්‍රී ලංකාව තුළ සුළං බලශක්ති විභවය ඉතා ඉහළ මට්ටමක පවතී. මෙරට ගොඩබිම් සුළං ධාරිතාව මෙගාවොට් 5,600ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, ඉන් දැනට සංවර්ධනය කර ඇත්තේ මෙගාවොට් 267ක් පමණි. විශේෂයෙන්ම මන්නාරම සුළං බලාගාර කොරිඩෝව සහ ඒ ආශ්‍රිත වෙරළබඩ කලාපවල ඉතා ප්‍රශස්ත සුළං සම්පතක් ඇති අතර, එම ප්‍රදේශවල සාමාන්‍ය සුළං වේගය තත්පරයට මීටර් 8-9ක් තරම් වේ. මුහුදුබඩ සුළං බලශක්ති විභවය ගිගාවොට් 56ක් වැනි විශාල අගයක් ගන්නා අතර, ඉන් ගිගාවොට් 27ක් ස්ථාවර අත්තිවාරම් (fixed-bottom foundations) සඳහාත්, ගිගාවොට් 29ක් පාවෙන සුළං තාක්ෂණය (floating wind technologies) සඳහාත් සුදුසු බව හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, ජනගහනය වර්ධනය වන විට අඩු වියදම් බලශක්තිය සඳහා පවතින ඉල්ලුම ද ඒ හා සමානව ඉහළ යනු ඇත. එබැවින්, සූර්ය, සුළං සහ තාප විදුලි බලශක්ති ක්ෂේත්‍රවල ආයෝජනය කරමින් බලශක්ති ඵලදායිතාව ඉහළ නැංවීම, සැමට තිරසාර ලෙස බලශක්තිය ලබා දීමට මහඟු පිටුවහලක් වනු ඇත.




ආදායම් විෂමතාවය අවම කිරීමටත්, අවදානම් තත්ත්වයන් අඩු කිරීමටත්, මිනිස් ගෞරවය සුරක්ෂිත කිරීමටත්, තිරසාර ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමටත් යහපත් රැකියා අවස්ථා සඳහා ප්‍රවේශය අත්‍යවශ්‍ය වේ. යහපත් රැකියාවක් යනු ආර්ථික කම්පනයන් හමුවේ වුවද ජීවනෝපාය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය වැටුප් සහ සමාජ ආරක්ෂණ ක්‍රමවේද සහිත රැකියාවකි.
යහපත් රැකියාවක නියම මිනුම්දණ්ඩ වන්නේ විධිමත් රැකියා අංශයයි. විධිමත් සේවකයෙකු යනු තම සේවායෝජකයා විසින් සේවක අර්ථසාධක අරමුදලකට දායක මුදල් ගෙවනු ලබන සේවකයෙකි. ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ආදායමෙන් අඩකට වඩා ලැබෙන්නේ වැටුප් සහ දීමනා මගිනි. තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) මගින් තිරසාර ආර්ථික වර්ධනය, ඉහළ ඵලදායිතාව සහ තාක්ෂණික නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ගෝලීය ඉලක්කයේ අවසාන අරමුණ වන්නේ 2030 වසර වන විට සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා පූර්ණ හා ඵලදායී රැකියා මෙන්ම යහපත් සේවා කොන්දේසි සහිත රැකියා අවස්ථා සහතික කිරීමයි.




ප්‍රවාහනය, වාරිමාර්ග, බලශක්තිය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වැනි යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම, බොහෝ රටවල තිරසාර සංවර්ධනය අත්කර ගැනීමටත්, ප්‍රජාවන් සවිබල ගැන්වීමටත් අත්‍යවශ්‍ය සාධකයකි. ඵලදායිතාව සහ ආදායම් මට්ටම ඉහළ නැංවීමටත්, සෞඛ්‍ය සහ අධ්‍යාපන අංශවල දියුණුවක් ඇති කිරීමටත් යටිතල පහසුකම් සංවර්ධනය අත්‍යවශ්‍ය බව බොහෝ කලක සිට පිළිගැනේ.

කුඩා පරිමාණ කර්මාන්ත සහ අනෙකුත් ව්‍යාපාර සඳහා ප්‍රවේශය පුළුල් කිරීම, ග්‍රාමීය ප්‍රදේශවලට මනා ප්‍රවාහන පහසුකම් ලබා දීම සහ පොදු භාවිතය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම මගින් තිරසාර සහ ශක්තිමත් යටිතල පහසුකම් සංවර්ධනයට මග පාදයි. යටිතල පහසුකම් සංවර්ධන කටයුතු, ක්‍රීඩාංගණ ප්‍රතිසංස්කරණය කිරීම, ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ග්‍රාමීය මාර්ග නවීකරණය සහ පොදු ශාලා ඉදිකිරීම වැනි කාර්යයන් කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා සෘජු දායකත්වයක් ලබා දෙනු ඇත.




අප දිස්ත්‍රික්කයේ අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු හරහා පාසල්, ආගමික ස්ථාන සහ ප්‍රජාව සඳහා වැදගත් වන ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී. මෙවැනි ව්‍යාපෘති මගින් සමාජ ඒකාබද්ධතාවය සහ සහජීවනය තවදුරටත් ශක්තිමත් වනු ඇත. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සමානාත්මතාවය සහතික කර ඇති අතර, ජාත්‍යන්තර සම්මුතීන් හරහා සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් පිටුදැකීමට ද රට කැපවී සිටී. කෙසේ වෙතත්, ස්ත්‍රී-පුරුෂ භේදය මත පදනම් වූ නීති, ප්‍රතිපත්ති සහ භාවිතයන් තවමත් පවතින අතර, ඒවා කාන්තාවන්ගේ, ළමයින්ගේ මෙන්ම සමස්ත ජාතියේම අයිතිවාසිකම්, ආරක්ෂාව සහ අවස්ථාවන් කෙරෙහි අහිතකර ලෙස බලපාමින් තිබේ.




ශ්‍රී ලංකාවේ බොහෝ නාගරික ප්‍රදේශ සංවර්ධන කටයුතු සහ ඉහළ ජනගහන ඝනත්වය හේතුවෙන් විවිධ පාරිසරික ගැටලුවලට මුහුණ දී තිබේ. තිරසාර සංවර්ධන ඉලක්ක අංක 11 (SDG 11) හි ප්‍රගතිය සලකා බලමින්, මෙම පරිච්ඡේදය තුළ වර්තමාන තත්ත්වය සහ ඒ ආශ්‍රිත නිර්දේශ පහත තේමාවන් යටතේ සාකච්ඡා කෙරේ: ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ උපාය මාර්ග, නගර සහ ඒවායේ පාලන ක්‍රමවේද, සියල්ලන් ඇතුළත් නාගරික සැලසුම්කරණය, නාගරික ප්‍රතිපත්ති සඳහා ජාතික මට්ටමින් මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සහ අවතැන්වීම් හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලීන්.මීට අමතරව, සංචාරක අමාත්‍යාංශයේ මූල්‍ය දායකත්වයෙන් මන්නාරම කොටුව ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින අතර, එය මන්නාරම සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා විශාල පිටුවහලක් වනු ඇත.

# 6. 06 වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

## 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 35 | 28 | 07 |
| තෘතීයික | 19 | 04 | 15 |
| ද්විතීයික | 545 | 508 | 37 |
| ප්‍රාථමික | 69 | 34 | 35 |
| **එකතුව** | **668** | **574** | **94** |

## 6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා 02 ක් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහ සඳහා 05 ක් ලෙස කාර්මික නිලධාරී තනතුරු 07 ක් අනුමත කර තිබුණද දැනට එම තනතුරේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා කොන්ත්‍රාත් පදනම මත පත් කර ඇත්තේ එක් තාක්ෂණික නිලධාරියෙකු පමණි. එම නිසා ඇස්තමේන්තු සකස් කිරීම, වැඩ අධීක්ෂණය, ටෙන්ඩර් පටිපාටි සහ බිල්පත් පරීක්ෂා කිරීම ආදී සියළු කටයුතු තාක්ෂණ සහකරුවන් සහය ඇතිව වැඩබලන දිස්ත්‍රික් ඉංජිනේරුවරයා විසින් සිදුකරනු ලබයි. මේ හේතුවෙන් එක් එක් සංවර්ධන ව්‍යාපෘතියක්ම නියමිත කාලරාමුව තුලදී නිරීක්ෂණය හා ක්‍රියාත්මක කිරීමේදී විශාල වැඩකොටසක් එක්රැස්වී ඇත.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා සිංහල - දෙමළ භාෂා පරිවර්ථක තනතුරු 06 ක් අනුමත කර තිබුණද මේ දක්වා භාෂා පරිවර්ථක තනතුරේ නිලධාරීන් කිසිවකු අනුයුක්ත කොට නොමැත. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහක කාර්ය සාධනය සහ ඵලදායීතාව වර්ධනය සඳහා සිංහල - දෙමළ භාෂා පරිවර්ථකයින් අවශ්‍ය වන අතර එය සේවාලාභීන්ගේ තෘප්තියට රුකුලක් වනු ඇත.

- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහ සඳහා කාර්යාල සේවක සේවයේ තනතුරු 48 ක් අනුමත කර තිබුනද 2025 වර්ෂයේදී මෙම තනතුරේ සේවකයින් 23 දෙනකු පමණක් අනුයුක්ත කර සිටී. මෙය අනුමත සංඛ්‍යාවෙන් අඩකටත් වඩා අඩු ප්‍රමාණයකි. මෙම නිසා දෙවන පෙළ නිලධාරීන් දුෂ්කරතාවයන්ට මුහුණ දෙන අතරම මෙම තත්වය කාර්යක්ෂම සේවාවන් සැලසීමේලා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහට අභියෝගයක්ව ඇත.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 145 ක් අනුමත කර තිබුනද දැනට අනුයුක්ත කර සිටින්නේ නිලධාරීන් 86 ක් පමණි. යහපත් රාජ්‍ය සේවයක් ලබාදීම සඳහා කළමනාකරණ ක්‍රියාකාරකම්වලට සහය වීමට කළමනාකරණ සේවා නිලධාරීගේ සේවය අත්‍යවශ්‍ය වේ.

- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරී වසම් සඳහා සංවර්ධන නිලධාරී සේවයේ තනතුරු 213 ක් අනුමත කර තිබුනද දැනට සංවර්ධන නිලධාරීන් 267 දෙනකු සේවයට අනුයුක්ත කර ඇත. මෙම නිසා කාර්යාල උපකරණ සහ අනෙකුත් පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් දෛනික කටයුතුවලදී දුෂ්කරතා මතුව ඇත.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා රියදුරු තනතුරු 19ක් අනුමත කර ඇත. කෙසේ වෙතත්, වර්තමානයේ රියදුරන් 11 දෙනෙකු පමණක් අනුයුක්ත කර ඇත. ඒ අනුව, රියදුරු තනතුරු සඳහා පුරප්පාඩු 08ක් පවතී. මෙම පුරප්පාඩු තත්ත්වය අත්‍යවශ්‍ය පරිපාලන හා ක්ෂේත්‍ර කටයුතු විධිමත්ව සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම කෙරෙහි අහිතකර ලෙස බලපායි.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු '000) | | වැඩ සටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැවුම / ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | වි දේ ශීය | | |
| තාක්ෂණ නිලධාරීන් සඳහා මිනුම්කටයුතු සහ මට්ටම්කරණ පුහුණු කඳවුරු | 04 | දින 5 යි | 118,000.00 | - | දේශීය | මිනුම් කටයුතු පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| SYSCGAA 2.0 පුහුණු වැඩසටහන - GPS පැමිණීම් පද්ධතිය | 50 | දින 1 යි | 19,410.00 | - | දේශීය | GPS පැමිණීම් පද්ධතිය පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා පරිපාලන රෙගුලාසි (AR) සහ මුදල් රෙගුලාසි (FR) පිළිබඳ පුහුණු වැඩසටහන | 30 | දින 2 යි | 48,777.00 | - | දේශීය | පරිපාලන රෙගුලාසි (AR) සහ මුදල් රෙගුලාසි (FR) පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම (RTI) පුහුණු වැඩසටහන් | 74 | පැය 3 යි | 28,960.00 | - | දේශීය | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම (RTI) පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| පැය 150 සිංහල පන්තිය | 60 | පැය 150 යි | 150,000.00 | - | දේශීය | සිංහල භාෂාව දියුණු කිරීම. |
| 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 82 වන වගන්තිය විධිවිධාන ප්‍රකාරව වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අදාළ පුහුණු වැඩසටහන | 110 | පැය 3 යි | 13,200.00 | - | දේශීය | විෂය දැනුම වර්ධනය කිරීම |
| රාජ්‍ය පරිපාලනය සහ කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය | 02 | වසර 1 යි | 330,000.00 | - | දේශීය | රාජ්‍ය අංශයේ පරිපාලන කුසලතා හා දැනුම වැඩිදියුණු කරන ලදී. |
| ඵලදායිතාව පිළිබඳ පුහුණු වැඩසටහන | 60 | දින 1 යි | 33,270.00 | - | දේශීය | තත්ත්ව කවය සහ තත්ත්ව කළමනාකරණය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වාචික ලේඛනගත කිරීමේ දත්ත එක්රැස් කිරීමේ කටයුතු සඳහා පුහුණු වැඩසටහන | 60 | දින ½ යි | 11,400.00 | - | දේශීය | විෂය දැනුම වර්ධනය කිරීම |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන | 40 | දින 2 යි | 96,181.14 | - | දේශීය | විෂය දැනුම වර්ධනය කිරීම |
| SYSCGAA 2.0 පද්ධතියේ කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence) සහ පෙරමුණු කාර්යාල (Front Office) පද්ධතිය භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන | 45 | දින 1 යි | 39,420.00 | - | දේශීය | කෘත්‍රිම බුද්ධිය (AI) සහ පෙරමුණු කාර්යාල පද්ධතිය පිළිබඳ විෂය දැනුම වැඩිදියුණු කිරීම |
| ජාතික ඵලදායිතා සම්මානය පිළිබඳ හැඳින්වීම හා පැහැදිලි කිරීම සඳහා වූ පුහුණු වැඩසටහන | 100 | දින 2 යි | 102,800.00 | - | දේශීය | ඵලදායිතා තරගාවලිය සඳහා සහභාගීවන්නන්ගේ ප්‍රතිශතය වර්ධනය කරගැනීම |
| ඵලදායිතා පුහුණු වැඩසටහන | 80 | දින 1 යි | 82,350.00 | - | දේශීය | කාර්ය කුසලතා වර්ධනය කරගැනීම මඟින් ඵලදායිතාව හා නිමැවුම් ප්‍රමාණය වැඩිදියුණු කිරීම |
| යහපත් සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා යෝගා පුහුණු වැඩසටහන | 80 | පැය 1.5 යි | 10,000.00 | - | දේශීය | මානසික සහ ශාරීරික සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම |
| නිවසේදී සිදුවන ස්වභාවික මරණ සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන | 102 | දින 1 යි | 70,400.00 | - | දේශීය | විෂය දැනුම වර්ධනය කිරීම |
| යහපත් සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා යෝගා පුහුණු වැඩසටහන | 70 | පැය 1.5 යි | 70,000.00 | - | දේශීය | මානසික සහ ශාරීරික සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම |
| යාපනය විශ්වවිද්‍යාලයේ කෘත්‍රිම බුද්ධිය (AI) පිළිබඳ පුහුණු වැඩසටහන | 100 | දින 2 යි | 149,917.00 | - | දේශීය | කෘත්‍රිම බුද්ධිය සම්බන්ධ විෂය දැනුම සහ අවබෝධය වර්ධනය කරගැනීමෙන් අනතුරුව, එය කාර්යාලීය කටයුතු සඳහා යොදා ගැනීම මඟින් කාර්යයන් වඩාත් කාර්යක්ෂමව, කඩිනමින් හා නිවැරදිව ඉටු කිරීමට හැකි විය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන | 50 | දින 1 යි | 24,630.00 | - | දේශීය | විෂය දැනුම වර්ධනය කිරීම |
| ඵලදායී හා සතුටුදායක සේවා පරිසරයක් ගොඩනැගීම සඳහා වූ අභිප්‍රේරණ පුහුණු වැඩසටහන | 84 | දින 2 යි | 6,000.00 | - | දේශීය | සේවකයන්ගේ කාර්යභාර සම්බන්ධතාවය හා රැකියා තෘප්තිය වර්ධනය කිරීම |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම (RTI) පුහුණු වැඩසටහන් | 90 | පැය 3 යි | 81,950.00 | - | දේශීය | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම (RTI) පිළිබඳ දැනුම වර්ධනය කිරීම |
| උපදේශන පුහුණු වැඩසටහන | 90 | පැය 3 යි | 30,452.00 | - | දේශීය | ධනාත්මක සේවා ආකල්පයකින් කටයුතු කරන නිලධාරීන්ගේ සංඛ්‍යාව වර්ධනය කිරීම |
| SYSCGAA 2.0 පද්ධතිය භාවිතා කර පැමිණීම ලියාපදිංචි කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 130 | දින 1 යි | 37,335.00 | - | දේශීය | විෂය දැනුම වැඩිදියුණු වීමත් සමඟ SYSCGAA 2.0 පද්ධතිය මගින් පැමිණීම ලබා ගැනීම කාර්යක්ෂමව සිදු කිරීම |
| ප්‍රසම්පාදන පුහුණු වැඩසටහන | 02 | මාස 6 යි | 16,000.00 | - | දේශීය | විෂය දැණුම වර්ධනය කිරීම |
| උපදේශන වැඩමුළුව - ප්‍රීතිමත් පවුලක් | 110 | දින 1 යි | 33,550.00 | - | දේශීය | නිලධාරීන්ගේ මානසික සෞඛ්‍ය ශක්තිය වැඩි දියුණු කිරීම |
| NPS නිර්ණායක පිළිබඳ හැඳින්වීමේ වැඩසටහන | 100 | දින 1 යි | 74,000.00 | - | දේශීය | නිර්ණායකයන් මගින් කාර්යාලීය ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම |
| ඵලදායිතාව – ගොනු කළමනාකරණ පුහුණු වැඩසටහන | 76 | පැය 6 යි | 38,450.00 | - | දේශීය | ගොනු පද්ධතිය වැඩිදියුණු කිරීම |
| ඵලදායිතා පුහුණු වැඩසටහන | 65 | පැය 6 යි | 46,697.75 | - | දේශීය | කාර්යාලීය කටයුතු වල ඵලදායිතාව වැඩිදියුණු කිරීම |
| ඵලදායිතා පුහුණු වැඩසටහන | 70 | පැය 6 යි | 50,340.00 | - | දේශීය | කාර්යාලීය කටයුතු වල ඵලදායිතාව වැඩිදියුණු කිරීම |
| භූගෝලීය තොරතුරු පද්ධතිය පිළිබඳ වැඩමුළුව | 66 | පැය 6 යි | 37,090.00 | - | දේශීය | භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) පිළිබඳ දැනුම වැඩිදියුණු |
| කලාප සිතියම පිළිබඳ ග්‍රාම නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන | 31 | පැය 7 යි | 12,790.00 | - | දේශීය | විෂය දැණුම වර්ධනය කිරීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඵලදායිතා පුහුණු වැඩසටහන | 75 | පැය 6 යි | 54,575.00 | - | දේශීය | කාර්යාලීය කටයුතු වල ඵලදායිතාව වැඩිදියුණු කිරීම |
| වැඩිහිටි සත්කාරය පිළිබඳ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන | 50 | පැය 6 යි | 11,625.00 | - | දේශීය | වැඩිහිටි සත්කාරය පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම |
| කෘත්‍රිම බුද්ධිය (AI) පිළිබඳ පුහුණු වැඩසටහන | 50 | පැය 3 යි | 21,280.00 | - | දේශීය | කෘත්‍රිම බුද්ධිය සම්බන්ධ විෂය දැනුම සහ අවබෝධය වර්ධනය කරගැනීමෙන් අනතුරුව, එය කාර්යාලීය කටයුතු සඳහා යොදා ගැනීම මඟින් කාර්යයන් වඩාත් කාර්යක්ෂමව, කඩිනමින් හා නිවැරදිව ඉටු කරගැනීමට හැකි විය |
| ඉදිකිරීම් හා තාක්ෂණික විෂයයන් පිළිබඳ වැඩමුළුව | 105 | පැය 3 යි | 18,000.00 | - | දේශීය | දැණුම වර්ධනය කිරීම |
| පරිපාලන රෙගුලාසි (AR) පිළිබඳ පුහුණු වැඩසටහන | 147 | පැය 6 යි | 32,330.00 | - | දේශීය | දැණුම වර්ධනය කිරීම |
| මුදල් රෙගුලාසි (FR) පිළිබඳ පුහුණු වැඩසටහන | 145 | පැය 6 යි | 31,850.00 | - | දේශීය | දැණුම වර්ධනය කිරීම |
| ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන | 75 | පැය 6 යි | 24,270.00 | - | දේශීය | දැනුම වැඩිදියුණු වීම මඟින් මිලදී ගැනීම් හා ඉදිකිරීම් ක්‍රියාවලීන්හි ඇති දෝෂ හා ගැටලු අඩු කර කාර්යක්ෂමතාව වැඩිදියුණු කරගැනීමට හැකි විය |
| **එකතුව** | | | **2,057,299.89** | | | |

## 7. 07 වන පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | - | - |
| 1.6 | වෙනත් | අදාල නොවේ | - | - |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම** (මු.රෙ. 445) | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම** (මු.රෙ. 135) | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014-05-11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීම | අනුකූල නොවේ | දත්ත රැස් කිරීමේ ප්‍රමාදය | ඉදිරියේදී මෙවන් ප්‍රමාදයන් වලක්වා ගන්නා ලෙසට අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදී තිබේ. |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | මාස 03ක් ඇතුළත පිළිතුරු ලබා දුන්නා | ඉදිරියේදී මාස 01ක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරන විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | - | - |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ෙඡ්දය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය, ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.4 | වාර්ෂිකභාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | - | - |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |
| 9.5 | 2016-12-29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල නොවේ | වාහන 2ක් අලුත්වැඩියා කිරීම සඳහා ගරාජයේ ඇත | අනාගතයේදී පියවර ගෙන තිබුණි |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | - | - |
| **10** | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අදාල නොවේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයත් ඇතුලත නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | රු. 1,371,155.87 ක් වටිනා හඳුනා නොගත් චෙක්පත් 2017 වර්ෂයේදී හමු විය | ළ නිලධාරියාගෙන් මේ දක්වා රු. 1,021,300ක මුදලක් අයකරගෙන ඇති අතර, ඉතිරි රු. 349,855.87ක මුදල මෙම වර්ෂය තුළ අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළැඹීම | අනුකූල වේ | - | - |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම. | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ නිල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | සේවය අත්හැර යාම සහ වැඩ තහනම් කිරීම | ඇපකර මගින් අයකර ගැනීමට පියවර ගෙන ඇත. |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | - | - |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදු කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | - | - |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයාට වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල නොවේ | සංවර්ධන නිලධාරීන්ගේ සැබෑ සේවක සංඛ්‍යාව අනුමත සේවක සංඛ්‍යාවට වඩා වැඩිය. | කළමනාකරණ සේවා නිලධාරීන් නොමැතිකම හේතුවෙන් අනුමත කාර්ය මණ්ඩලය වැඩි කිරීමට පියවර ගැනීම. |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 16.3 | 20-09-2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | - | - |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | - | - |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018-01-24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 19.4 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට කර තිබීම. | අනුකූල වේ | - | - |